2022 මුදල් වර්ෂය සඳහා වන අයවැය ඇස්තමේන්තු පිළිබඳව
පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 121(4) යටතේ
(මුදල් වෙන් කිරීම ආණ්ඩුවේ ප්‍රතිපත්තිවලට අනුකූල වන්නේද යන්න ඇතුළුව)

රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව

පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද්දේ

කාරක සභාවේ සභාපති
ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා විසිනි

2021 දෙසැම්බර් මස 8 වැනි බදාදා

பாராளுமன்ற நிலையியற் கட்டளை 121 (4) இன் கீழ்
2022 ஆம் நிதியாண்டிற்கான மதிப்பீடுகள்
தொடர்பிலான
(பணக் குறித்தொதுக்குகை அரசாங்கத்தின் கொள்கைகளிற்கு இணங்கியொழுகவுள்ளதா என்பது உட்பட மதிப்பீடுகள் தொடர்பானது)
அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை
குழுவின் தவிசாளர்
கௌரவ அநுர பிரியதர்ஷன யாப்பா அவர்களினால்
பாராளுமன்றத்திற்குசமர்ப்பிக்கப்பட்டது.
2021 திசம்பர் மாதம் 08 ஆம் திகதி புதன்கிழமை

Report of the Committee on Public Finance

On the Estimates for the Financial Year 2022 in terms of the Standing Order No. 121(4) of Parliament

(Including whether the allocation of money is in compliance with the policies of the Government)

presented to Parliament by

The Hon. Anura Priyadharshana Yapa
Chair of the Committee

Wednesday, the 8th of December, 2021.

කාරක සභාව

ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා (සභාපති)

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා

ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා

ගරු සුසිල් ප්‍රේමජයන්ත මහතා

ගරු විදුර වික්‍රමනායක මහතා

ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා

ගරු (ආචාර්ය) නාලක ගොඩහේවා මහතා

ගරු විජිත හේරත් මහතා

ගරු ඩිලාන් පෙරේරා මහතා

ගරු කුමාර වෙල්ගම මහතා

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා

ගරු මනුෂ නානායක්කාර මහතා

ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා

ගරු (වෛද්‍ය) කාවින්ද හේෂාන් ජයවර්ධන මහතා

ගරු මුජිබුර් රහුමාන් මහතා

ගරු ඉසුරු දොඩන්ගොඩ මහතා

ගරු අනුප පැස්කුවල් මහතා

ගරු නලින් ප්‍රනාන්දු මහතා

ගරු (මහාචාර්ය) රංජිත් බණ්ඩාර මහතා

2022 අයවැය: රජයේ ප්‍රතිපත්ති ප්‍රමුඛත්වයන් තක්සේරු කිරීම

1. වාර්තාව හැඳින්වීම

යෝජිත අයවැය ශ්‍රී ලංකා රජයේ (GOSL) ජාතික ප්‍රතිපත්ති රාමුව සමග දිශාගතව තිබෙදැයි තක්සේරු කොට වාර්තාවක් ඉදිරිපත් කිරීමේ කාර්යය පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 121 (4) අනුව රජයේ මුදල් පිළිබඳ කාරක සභාව (COPF) වෙත පැවරී තිබේ. මෙම වාර්තාව රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ එම ප්‍රයත්නයට දායක වෙයි. මෙම තක්සේරුව පදනම් වී ඇත්තේ 1) 2021 නොවැම්බර් 12 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද අයවැය කතාවෙහි දක්වා ඇති 2022 සඳහා වන අයවැය යෝජනා මත, 2) 2020 හා 2021 මුදල් වර්ෂ සඳහා වූ විසර්ජන පනත් කෙටුම්පත්, 3) මුදල් අමාත්‍යාංශය (MOF) විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු මත පදනම් වී ඇත.

මෙම වාර්තාව මගින් 2022 මුදල් ප්‍රතිපාදනය ජාතික ප්‍රතිපත්ති රාමුව වන සෞභාග්‍යයේ දැක්ම (VPS) තුළ විග්‍රහ කර ඇති ආණ්ඩුවේ ප්‍රතිපත්තිත් සමග අනුගත වේද යන්න තක්සේරු කෙරේ. සෞභාග්‍යයේ දැක්ම (VPS) මුඛ්‍ය ප්‍රතිපත්ති 10 ක් වටා සංකේන්ද්‍රණය වී තිබේ. ඒවා නම්:- 1) ජාතික ආරක්ෂාව කෙරෙහි ප්‍රමුඛත්වය; 2) මිත්‍රශීලී, නොබැඳි විදේශ ප්‍රතිපත්තිය; 3) දූෂණයෙන් තොර පරිපාලනය; 4) ජනතා පැතුම් ඉටු කරන නව ව්‍යවස්ථාව; 5) ඵලවත් පුරවැසියෝ සහ ජවසම්පන්න මානව සම්පත; 6) ජනතා-කේන්ද්‍රික ආර්ථික සංවර්ධනය; 7) තාක්ෂණය-පාදක සමාජය; 8) භෞතික සම්පත් සංවර්ධනය; 9) තිරසාර පරිසර කළමනාකරණය; සහ 10) විනය-ගරුක, නීති-ගරුක හා සාරධර්ම සපිරි සමාජය යන මේවායි. මෙවක් පටන් මෙම වාර්තාව තුළ මෙම ප්‍රතිපත්ති ප්‍රමුඛත්වයන් VPS-1, VPS-2 යනාදි වශයෙන් VPS-10 දක්වා වූ කේතවලින් හැඳින්වෙනු ඇත. මුදල් අමාත්‍යාංශය විසින් සපයන ලද තොරතුරු මත පදනම්ව, සියලු ගණනය කිරීම් වලදී 2022 දී දළ දේශීය නිෂ්පාදිතය (GDP) රුපියල් බිලියන 18,511 ක් ලෙස උපකල්පනය කර ඇත.

2. සාර්ව-ආර්ථික කළමනාකරණය

කොවිඩ්-19 වසංගතයේ ආර්ථික බිඳවැටීම මෙම ඉලක්ක සපුරා ගැනීමේදී අභියෝග කිහිපයක් මතු කර ඇත. ඒ අනුව, 2022අයවැය මගින් 2022 වර්ෂය තුළ 5% ක ආර්ථික වර්ධන වේගයක්, 6% හා 7% අතර වාර්ෂික උද්ධමන අනුපාතිකයක් හා 8.8% ක මූල්‍ය හිඟයක් අපේක්ෂා කරයි. සෞභාග්‍යයේ දැක්ම (VPS) තුළ දක්වා ඇති මුඛ්‍ය සාර්ව-ආර්ථික ඉලක්කවලට පහත ඒවා ඇතුළත් වේ:

- 6.5% ක හෝ ඊට වඩා වැඩි ආර්ථික වර්ධනයක් සාක්ෂාත් කර ගැනීම
- 5% නොඉක්මවන වාර්ෂික උද්ධමන අනුපාතිකය
- 4% ට වඩා අඩු අයවැය හිඟය
- තනි ඉලක්කමක පොළී අනුපාතිකය
- රුපියලෙහි හුවමාරු අගය ස්ථායි මට්ටමක පවත්වා ගැනීම

අයවැය හිඟය

2022 සඳහා ඇස්තමේන්තු කර ඇති අයවැය හිඟය විශාල ලෙසම වාර්ෂික රාජ්‍ය ආදායම් වර්ධනය දෘඪතර 48% ක් වේය යන උපකල්පනය මත ය. මෙය ආර්ථික ශක්තිමත් ලෙස යථා තත්ත්වයට පත්වීම මත පමණක් නොව, එම යථා තත්ත්වයට පත්වීම පුළුල්-පාදක එකක් වීම මත ද රඳා පවතී. සමස්තයක් වශයෙන් වඩා තදබල සාර්ව ආර්ථික කොන්දේසි පැවතීම අපේක්ෂා කරන බැවින්, ආදායම් වර්ධනය අපේක්ෂණයන්ට අඩු වනු ඇත. කෙසේ වුවද, අඩුව යම් තරමකට පියවීම පිණිස (සාමාන්‍යයෙන් කෙරෙන පරිදි) රාජ්‍ය ආයෝජන වියදම අයවැයගත ප්‍රමාණ කෙරෙන් සීරුමාරු කිරීම සඳහා ද ඉඩකඩ පවතින බව පෙනී යයි.

උද්ධමනය

දේශීය මෙන්ම විදේශීය සාධක ගණනාවක් හේතුවෙන් ශ්‍රී ලංකා ආර්ථිකය තුළ උද්ධමන පීඩනයන් පැන නගී. දේශීය සාධකයන්ට කොවිඩ්-19 ප්‍රකෘතනය ආශ්‍රිත දැඩි ද්‍රවශීලීතා නික්ෂේපනය, සැපයුම් බිඳවැටීම් සහ මුදලේ අගය අඩුවීම වෙතින් වූ ආනයනික උද්ධමනය ඇතුළත්ය. ඉහළ යන ගෑස් හා තෙල් මිලගණන් ස්වරූපයෙන් වූ බාහිර ප්‍රවණතාවන්ද මෙම පීඩනයන්ට අළුතින් එකතු වනු ඇත. වාර්ෂිකෘත උද්ධමනය 2022 වර්ෂය තුළ තනි ඉලක්කමක පවතිනු ඇතැයි අපේක්ෂා කළ හැකි අතරම, ප්‍රවණතාවෙහි ඉහළ නැඹුරුව අඛණ්ඩව පවතිනු ඇත.

පොළී අනුපාතික

අන් ඒවාට අමතරව, සැලකිය යුතු ද්‍රවශීලතා නික්ෂේපනයන් හා ආදායම් පාලන ක්‍රියාමාර්ග මගින් කොවිඩ්-19 අර්බුදය හරහා පොළිය පහළ මට්ටමක තබා ගැනීමට හැකි විය. 2022 අයවැය තුළ දැක්වුණු පරිදි, දේශීය අයවැය හිඟය පියවීම සඳහා වූ විශාල මූල්‍යන අවශ්‍යතාවන් (විශේෂයෙන්ම දේශීය බැංකුවලින් ණයට ගැනීම) පොළී අනුපාතිකයන්හි වත්මන් ඉහළත සංචලනය කලක් පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ. 2021 නොවැම්බර් මැද 8.2% ක පැවති 364-දින මහා භාණ්ඩාගාර බිල්පත් අනුපාතිකය ද සමගින් පොළී අනුපාතිකයන් තනි ඉලක්කම ඉක්මවා යාමේ ප්‍රබල හැකියාවක් පවතී.

විනිමය අනුපාතිකය

ශ්‍රී ලංකා රුපියල, ඇමරිකන් ඩොලරයට සාපේක්ෂව (රුපියල් 200 ක) නියත නිල අනුපාතිකයකින් පවත්වා ගෙන යනුයේ, වෙළඳපල අපේක්ෂණයන් සමාන්තර මලින වෙළඳපලක බිහිවීම දකිමින් සිටින අතරේය. විදේශ ණය බැරකම් ගෙවා දැමීමට හා විදේශ මුදල් සංචිත ගොඩනැගීමට අවශ්‍ය විශාල විදේශීය මුදල් සම්භාරය හමුවේ ප්‍රාග්ධන මුදල් ලෙස ප්‍රමාණවත් මට්ටමක විදේශ මුදල් ප්‍රමාණයක් ඇතුළතට ප්‍රවාහය වීම අවශ්‍ය කෙරේ. (වර්ෂය සඳහා ප්‍රක්ෂේපිත ඇමෙරිකන් ඩොලර් බිලියන 4.5 ක පරාසය තුළ පිහිටි විදේශ මුදලින් කළ යුතු ණය පියවීම්වලට සාපේක්ෂව 2021 ඔක්තෝබර් මාසයේ පැවති සංචිත ප්‍රමාණය ඇමෙරිකන් ඩොලර් බිලියන 2.3 කි.) ප්‍රමාණවත් මට්ටමකට සලකා බලන කල, එබඳු වර්ධනයක් ඇති වන තුරු, වෙළඳපල විසින් මෙහෙයවනු ලබන ස්ථාවර විනිමය අනුපාතිකයක් පවත්වා ගැනීම අතිශයින්ම අභියෝගාත්මක කාර්යයකි.

නිමැවුම් වර්ධනය

2021 වර්ෂය තුළදී ප්‍රතිදාන මට්ටම් වසංගතයට පෙර පැවති මට්ටම්වලට යලි පැමිණෙමින් ඇති අතරේ 2022 වර්ෂය තුළ 5% ක වර්ධන ඉලක්කයක් සාක්ෂාත් කර ගැනීම එයටත් වඩා අභියෝගාත්මක වනු ඇත. ඉහළ යන පොළී අනුපාතිකයන් පුරෝකථනය කරන ලද වර්ධනය තර්ජනයට ලක් කරමින් වර්ධනය උත්තේජනය කිරීම සඳහා අල්ප අවකාශයක් ඉතිරි කරනු ඇත. පරිභෝජනයද වර්ධනය කිරීම වේගවත් කිරීමෙහිලා ඉතා මද බලපෑමක් කරනු ඇත්තේ උද්ධමනය විසින් කුටුම්භයන්හි උපයෝජ්‍ය ආදායම (වැය කළ හැකි ආදායම) සෝදා පාළුවට ලක් කරන බැවිනි. සම්භව්‍යතා සමබර කර බැලීමකදී, යටිතල පහසුකම් හා ඉදිකිරීම් ව්‍යාපෘතීන් තුළ විදේශීය සෘජු ආයෝජන (FDI) ආශ්‍රිත ආයෝජනයන් සැලකිය යුතු ප්‍රමාණයෙන් ප්‍රගමණය වන්නේ නම්, වර්ධනය ඉහළ යා හැකි වන නමුදු, රාජ්‍ය ආදායම් මත බලපෑම් (පටු වර්ධන පදනම, බදු නිදහස් කිරීම් ආදිය හේතුවෙන්) සීමිතව පවතින්නට ඉඩ තිබේ.

3. ශ්‍රී ලංකා රජයේ ප්‍රතිපත්ති ප්‍රමුඛත්වයන් සිසාරා සමස්ත වැය යෝජනා බෙදී යන ආකාරය

වගු අංක 1 හා 2 සහ උපග්‍රන්ථයේ අ.4 වගුව මගින් විවිධ ප්‍රතිපත්ති ප්‍රමුඛත්වයන් සිසාරා වැය යෝජනාවන් බෙදී යන ආකාරය දැක්වේ. ප්‍රතිපත්ති ප්‍රමුඛත්වයන් මුළුල්ලේ වැය බෙදී යාම අසමානය (1 රූපය බලන්න). අයවැයෙහි විශාලතම කොටස (මුළු අයවැයෙන් 65% ක් හෙවත් දළ දේශීය නිෂ්පාදිතයෙන් 19% කට සම ප්‍රමාණයක්) දූෂණයෙන් තොර පරිපාලනය සඳහා ප්‍රතිපාදනය කර තිබේ. මෙය ශ්‍රී ලංකාවේ ණය සේවා පිරිවැය මත පොළී ගෙවීම් සපුරාලීම සඳහා වැය වන සැලකිය යුතු වියදමෙහි ප්‍රතිඵලයකි. ජාතික ආරක්ෂාව සඳහා වූ VPS-1 අයවැයෙහි මීළඟ ඉහළම පංගුවයි (මෙය සමස්ත වැයෙන් 11% ක් හෙවත් දළ දේශීය නිෂ්පාදිතයෙන් 3.3 % කි). 10% ට වැඩි

ප්‍රතිශතයක් ලබන එකම ප්‍රතිපත්ති ක්ෂේත්‍රය වන්නේ VPS-1 'ජාතික ආරක්ෂාව කෙරෙහි ප්‍රමුඛතාව'යි. කෙසේ වුවද, මෙම ප්‍රමුඛත්වයෙන් 76% ක්ම පුනරාවර්තන වියදම් සඳහා වේ.

VPS-5 හා VPS-8 යන දෙකම සමස්ත ප්‍රතිපාදනයෙන් 10% කට ආසන්න ප්‍රතිපාදනයක් ලබන අතරම, සාමාජීය අංශය කොවිඩ්-19 වසංගතයෙන් තදබල ලෙස බලපෑමට ලක්වීම හමුවේ, එම අංශයට තවත් ආයෝජන ලබා දෙන්නේ නම් එය යහපත් වනු ඇත. කෙසේ වුවද, සෞඛ්‍යය හා අධ්‍යාපනය වැනි සාමාජීය ක්ෂේත්‍රය පිළිබඳව කටයුතු කරන අමාත්‍යාංශවලින් වැඩි කොටසක් ඇතුළත් VPS-5 සඳහා ප්‍රතිපාදනය කර ඇත්තේ 9.8% (දළ දේශීය නිෂ්පාදිතයෙන් 2.9% ට සම මුදලක්) පමණ ය. මෙම ප්‍රතිපාදනයෙන්ද 85% ක්ම පුනරාවර්තන වියදම් සඳහා වේ. මෙය මෙම ප්‍රතිපත්ති ප්‍රමුඛත්වය යටතේ එන අමාත්‍යාංශවල රාජ්‍ය අංශ ශ්‍රම බලකායේ විශාලත්වය නිසා ය.

අන් සියලුම ක්ෂේත්‍රවලට ලැබී ඇත්තේ 3% ක් හෝ ඊට අඩු ප්‍රමාණයකි. රටෙහි ආර්ථික කටයුතු තවමත් මන්දගාමී තත්ත්වයක පැවතීම සැලකිල්ලට ගෙන, VPS-6 (ජනතා-කේන්ද්‍රික ආර්ථික සංවර්ධනය) සඳහා වඩා වැඩි රාජ්‍ය ආයෝජන ලබා දුන්නේ නම් ආර්ථික ප්‍රකෘතනය වේගවත් කළ හැකිව තිබුණි. එමෙන්ම, තාක්ෂණ-පාදක සමාජයක් සංවර්ධනය කිරීම ශ්‍රී ලංකා රජයේ ඉතා ප්‍රමුඛ ප්‍රතිපත්ති ප්‍රමුඛත්වයක් වන අතරම, එම ප්‍රතිපත්ති ක්ෂේත්‍රය වෙනුවෙන් වෙන් කෙරෙනුයේ ආන්තික ප්‍රතිපාදනයක් පමණි.

1 වගුව: ශ්‍රී ලංකා රජයේ ප්‍රතිපත්ති ප්‍රමුඛතා සිසාරා 2022 වැය ප්‍රතිපාදන යෝජනා බෙදී යන ආකාරය (ශ්‍රී ලංකා රුපියල් බිලියන)

	පුනරාවර්තන	ප්‍රාග්ධන	එකතුව
1. ජාතික ආරක්ෂාව කෙරෙහි ප්‍රමුඛත්වය	466	148	614
2. මිත්‍රශීලී, නොබැඳි විදේශ ප්‍රතිපත්තිය	13	0	13
3. දූෂණයෙන් තොර පරිපාලනය	1,837	1,682	3,519
4. ජනතා පැතුම් ඉටු කරන නව ව්‍යවස්ථාව	-	-	-
5. ඵලවත් පුරවැසියෝ සහ ජවසම්පන්න මානව සම්පත	451	82	533
6. ජනතා ක ආර්ථික සංවර්ධනයකේන්ද්‍රි-	89	80	169
7. තාක්ෂණය පාදක සමාජය-	3	4	6
8. භෞතික සම්පත් සංවර්ධනය	33	456	489
9. තිරසාර පරිසර කළමනාකරණය	5	8	14
10. විනයගරුක-, නීති ගරුක හා සාරධර්ම සපිරි සමාජය-	45	17	62
එකතුව	2,943	2,477	5,420

මූලාශ්‍රය: පාර්ලිමේන්තුව විසින් සපයන ලද දත්ත මත පදනම් වූ ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතන ගණනයන්

සටහන:- විවිධ ප්‍රතිපත්ති ප්‍රමුඛත්වයන්ට වැය ප්‍රතිපාදන යෝජනා වෙන් කිරීමෙහිලා කරන ලද උපකල්පනයන් ඇමුණුම 1 හි දී ඇත.

2 වගුව: ශ්‍රී ලංකා රජයේ ප්‍රතිපත්ති ප්‍රමුඛතා සිසාරා වූ අයවැය යෝජනාවන්ද ඇතුළත්ව වියදම බෙදී යන ආකාරය

	ලංකා රුපියල් බිලියන	**බෙදීයාමේ ප්‍රතිශතය (%)**	**2022 දළ දේශීය නිෂ්පාදිතයේ (GDP) ප්‍රතිශතයක් ලෙස**
1. ජාතික ආරක්ෂාව කෙරෙහි ප්‍රමුඛත්වය	614	11.3	3.3
2. මිත්‍රශීලී, නොබැඳි විදේශ ප්‍රතිපත්තිය	13	0.2	0.1
3. දූෂණයෙන් තොර පරිපාලනය	3,519	64.9	19.0
4. ජනතා පැතුම් ඉටු කරන නව ව්‍යවස්ථාව	-	-	-
5. ඵලවත් පුරවැසියෝ සහ ජවසම්පන්න මානව සම්පත	533	9.8	2.9
6. ජනතා-කේන්ද්‍රික ආර්ථික සංවර්ධනය	169	3.1	0.9
7. තාක්ෂණය-පාදක සමාජය	6	0.1	0.0
8. භෞතික සම්පත් සංවර්ධනය	489	9.0	2.6
9. තිරසාර පරිසර කළමනාකරණය	14	0.2	0.1
10. විනය-ගරුක, නීති-ගරුක හා සාරධර්ම සපිරි සමාජය	62	1.2	0.3
එකතුව	5,420	100.0	29.3

මූලාශ්‍රය: පාර්ලිමේන්තුව විසින් සපයන ලද දත්ත මත පදනම් වූ ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතන ගණනයන්

සටහන:- විවිධ ප්‍රතිපත්ති ප්‍රමුඛත්වයන්ට වැය ප්‍රතිපාදන යෝජනා වෙන් කිරීමෙහිලා කරන ලද උපකල්පනයන් ඇමුණුම 1 හි දී ඇත. මුදල් අමාත්‍යාංශය විසින් සපයන ලද තොරතුරු මත පදනම්ව, 2022 වර්ෂය සඳහා වූ දළ දේශීය නිෂ්පාදිතය (GDP) ලංකා රුපියල් බිලියන 18,511 ක් ලෙස උපකල්පනය කර ඇත.

1 රූපය: ශ්‍රී ලංකා රජයේ ප්‍රතිපත්ති ප්‍රමුඛතා සිසාරා වූ අයවැය යෝජනාවන්ද ඇතුළත්ව වැය බෙදී යන ආකාරය (%)



මූලාශ්‍රය: පාර්ලිමේන්තුව විසින් සපයන ලද දත්ත මත පදනම් වූ ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතන ගණනයන්

Priority to national security = ජාතික ආරක්ෂාව කෙරෙහි ප්‍රමුඛතාව * Friendly, non-aligned, foreign policy = මිත්‍රශීලී, නොබැඳි විදේශ ප්‍රතිපත්තිය * An administration free from corruption = දූෂණයෙන් තොර පරිපාලනය * New Constitution that fulfills the people's wishes = ජනතා පැතුම් ඉටු කරන නව ව්‍යවස්ථාව * Productive citizenry and a vibrant human resource = ඵලවත් පුරවැසියෝ සහ ජවසම්පන්න මානව සම්පත * People centric economic development = ජනතා-කේන්ද්‍රික ආර්ථික සංවර්ධනය * Technology based society = තාක්ෂණය-පාදක සමාජය * Development of physical resources = භෞතික සම්පත් සංවර්ධනය * Sustainable environmental management = තිරසාර පරිසර කළමනාකරණය * Disciplined, law abiding and values-based society = විනය-ගරුක, නීති-ගරුක හා සාරධර්ම සපිරි සමාජය * Recurrent = පුනරාවර්තන * Capital = ප්‍රාග්ධන * LKR billions = ශ්‍රී ලංකා රුපියල් බිලියන

3 වගුවෙන් කාර්යන් වර්ගීකරණයන් සිසාරා රජයේ වියදම බෙදී ගොස් ඇති ආකාරය දැක්වේ. අධ්‍යාපනය, ආර්ථික සේවා, කෘෂිකර්මය හා වාරිමාර්ග යන ක්ෂේත්‍රයන් හැර වෙනත් කාර්යයන් සඳහා වූ වැය 2021 වර්ෂයට සාපේක්ෂව 2022 වර්ෂයේදී දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස ගත් කල වර්ධනය වී ඇති බව පෙනෙනු ඇත. මෙය ප්‍රධාන වශයෙන් 2021 වර්ෂයට සාපේක්ෂව 2022 වර්ෂයේදී පොළී ගෙවීම් වර්ධනය වීම නිසා ඇති වූවකි. මෙමගින් රාජ්‍ය මූල්‍ය පාලන අවකාශයක් තිබීම මගින් රාජ්‍ය ආයෝජනයන් අනතුරට වැටෙන බවට සංඥා කෙරෙන අතර එමගින් රජයේ වියදම සුමට කිරීමෙන් හා ආදායම වැඩි කිරීමෙන් අයවැය හිඟයන් අඩු කිරීම සඳහා බලවත් අවශ්‍යතාවක් ඇති බවට සංඥා කෙරේ.

3 වගුව: ක්‍රියාකාරීත්ව වර්ගීකරණයට අනුව ආණ්ඩුවේ වියදම් බෙදී යාම

විෂය	2021 සංශෝධිත ඇස්තමේන්තු		2022 ඇස්තමේන්තු		වෙනස 2021 සිට 2022
	රු. මිලියන	% දළදේනි	රු. මිලියන	% දළදේනි	% දළදේනි
මුළු වියදම	4,015,045	24.37	3,888,100	21.03	(3.34)
පොදු රාජ්‍ය සේවා	76,448	0.46	56,300	0.30	(0.16)
සිවිල් පරිපාලනය	608,813	3.70	612,184	3.31	(0.38)
ආරක්ෂාව	379,526	2.30	370,696	2.01	(0.30)
පොලිසිය සහ මහජන ආරක්ෂාව	102,686	0.62	107,863	0.58	(0.04)
සමාජ සේවා	740	0.00	755	0.00	(0.00)
අධ්‍යාපනය	165,913	1.01	193,315	1.05	0.04
සෞඛ්‍ය	176,638	1.07	168,006	0.91	(0.16)
සුභසාධන	414,230	2.51	299,891	1.62	(0.89)
ප්‍රජා සේවා	23,351	0.14	17,993	0.10	(0.04)
ආර්ථික සේවා	43,565	0.26	49,343	0.27	0.00
කෘෂි සහ වාරිමාර්ග	104,923	0.64	124,349	0.67	0.04
බලශක්ති සහ ජල සැපයුම්	108,051	0.66	51,205	0.28	(0.38)
ප්‍රවාහනය හා සන්නිවේදනය	80,929	0.49	65,741	0.36	-0.13
වෙනත්	80,929	0.49	65,741	0.36	(0.14)
අනෙකුත්	752,232	4.57	654,612	3.54	(1.02)
එයින් පොලී අනුපාත ගෙවීම්	977,000	5.93	1,115,847	6.04	0.11

මූලාශ්‍රය : මුදල් අමාත්‍යාංශයෙන් ලබා දෙන ලද දත්ත පදනම් කරගත් ප්‍ර.අ.ආ. ගණනය කිරීම්

4. ශ්‍රී ලංකා ආණ්ඩුවේ ප්‍රතිපත්ති ප්‍රමුඛතා සහ 2021 අයවැය ආංශික වෙන්කිරීම්

4.1 විදේශ ප්‍රතිපත්තිය - (VPS -2)

විදේශ ප්‍රතිපත්තිය සඳහා ශ්‍රී ලංකා ආණ්ඩුවේ අයවැය වෙන්කිරීම විදේශ කටයුතු අමාත්‍යාංශය සහ කළාපීය සහයෝගිතාව පිළිබඳ රාජ්‍ය අමාත්‍යාංශයට වෙන් කර තිබේ. කළාපීය සහයෝගිතාව සඳහා වන රාජ්‍ය අමාත්‍යාංශය 2020 දී ස්ථාපිත කරන ලද අතර එය විදේශ කටයුතු අමාත්‍යාංශයේ ප්‍රතිපත්තිමය මහපෙන්වීම යටතේ ක්‍රියාත්මක වේ. සෞභාග්‍යයේ දැක්මට අනුව කළාපීය සහයෝගිතාව සඳහා වන දකුණු ආසියානු සංවිධානය (SAARC) සහ බහු ආංශික තාක්ෂණික සහ ආර්ථික සහයෝගිතාව සඳහා වන බෙංගාල බොක්කේ එකමුතුව (BIMSTEC) සමඟ සබඳතා ගොඩනාගාගැනීමේ අවශ්‍යතාව හඳුනාගෙන තිබේ. 2022 මූල්‍ය වර්ෂය සඳහා විදේශ ප්‍රතිපත්තියට අදාළ අමාත්‍යාංශ සඳහා වන අයවැය වෙන්කිරීම 2021 කරන ලද වෙන්කිරීම සමඟ සන්සන්දනාත්මකව බලන කළ විදේශ කටයුතු අමාත්‍යාංශයට සහ කළාපීය සහයෝගිතා රාජ්‍ය අමාත්‍යාංශයට 2022 වෙන් කරන ලද මුදල 1.8% ක වැඩිවීමක් පෙන්නුම් කරයි. දළ ජාතික නිෂ්පාදනයේ ප්‍රතිශතයක් වශයෙන් අමාත්‍යාංශ දෙකටම කරන ලද වෙන්කිරීම 2021 ට වඩා අඩුය. (වගුව 4). විදේශ ප්‍රතිපත්තිය පිළිබඳ වගකීම පවරා තිබෙන අමාත්‍යාංශ දෙකට 2022 අයවැය වියදමින් 0.344% ක් වෙන් කර තිබේ.

4 වගුව: විදේශ කටයුතු සඳහා අමාත්‍යාංශ වශයෙන් අයවැය වෙන් කිරීම (රු. මිලියන)

	2021			2022			2021	2022
	වර්තන	ප්‍රාග්ධන	මුළු එකතුව	වර්තන	ප්‍රාග්ධන	මුළු එකතුව	දළේනි % ලෙස	දළේනි %ලෙස
විදේශ කටයුතු අමාත්‍යාංශය	12,363	487	12,850	12,668	460	13,128	0.078	0.071
කළාපීය සහයෝගිතාව පිළිබඳ රාජ්‍ය අමාත්‍යාංශය	147	13	160	113	7	120	0.001	0.001

මූලාශ්‍රය : විසර්ජන පනත් කෙටුම්පත 2021 සහ 2022 සඳහා

2022 අයවැය යෝජනා වල විදේශ ප්‍රතිපත්තියට ඇති අදාළත්වය වන්නේ වෙළෙඳ විදේශ ප්‍රතිපත්තියේ සහ ආයෝජන විදේශ ප්‍රතිපත්තියේ ඇති බැඳියාවයි. 2022 අයවැය තුළින් 2027 වන විට ඇ.ඩො. 6,000 ක අතිරික්තයක් අපනයනය, සංචාරක කර්මාන්තය සහ විදේශ රැකියාවලින් ලැබෙන ආදායමෙන් ලබා ගැනීම පිළිබඳ අවධානය යොමුකර තිබේ. ඊට අමතරව විදේශීය පාරිභෝගිකයන්ට සේවාවන් සැපයීම සඳහා සෞඛ්‍ය සහ අධ්‍යාපන ක්ෂේත්‍ර සංවර්ධනය කිරීමේ වැදගත්මක පිළිබඳව ද සඳහන් කරන ලදී. ජාත්‍යන්තර ප්‍රජාව අතර ආයෝජන අවස්ථා ප්‍රවර්ධනය කිරීම, අපනයන අවස්ථා ලබාගැනීම, ශ්‍රී ලංකාවට ප්‍රයෝජනයක් ගතහැකි විදේශ රටවල ඇති ප්‍රවණතා සහ සංවර්ධනයන් විශ්ලේෂණය කිරීම සහ ශක්‍ය වූ වෙළෙඳ ගිවිසුම් හරහා වෙළෙඳ ඒකාබද්ධතාවන්ට පහසුකම් සැපයීම සම්බන්ධයෙන් තීරණාත්මක භූමිකාවක් මෙම අමාත්‍යාංශ දෙකම ඉටු කරනු ලැබේ. 2022 අයවැය කථාව තුළින් ද්විපාර්ශ්වික සහ බහුපාර්ශ්වික නියෝජිතායතන සමඟ ශ්‍රී ලංකාවේ පුළුල් වූ රාජ්‍යතාන්ත්‍රික සම්බන්ධතා ද මතුකර දක්වයි. පුළුල් වූ රාජ්‍ය තාන්ත්‍රික සබඳතා වල අරමුණ වන්නේ නොබැඳි සහ මිත්‍රශීලී ජාත්‍යන්තර සබඳතා ජාතික ප්‍රතිපත්ති රාමුව ට අනුව සිදු කිරීමයි. සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශයේ සඳහන් කර තිබෙන පරිදි ආසියානු රටවල් සමඟ ශක්තිමත් වෙළෙඳ සබඳතා ඇතිකර ගැනීම අපනයන වර්ධනය කරගැනීමට සහාය ලබා දෙයි.

විශේෂිත වැඩසටහන් සහ අරමුදල් වෙන්කිරීම් පිළිබඳව සඳහන් කර නොමැති නිසා අපේක්ෂාව විය හැක්කේ අමාත්‍යාංශ දෙකම අයවැය මගින් ඉදිරිපත් කර තිබෙන අදාළ අරමුණු ළඟාකරගැනීම සඳහා පවතින මෙහෙයුම් වල කාර්යක්ෂමතාව වැඩි කරගැනීම විය යුතුය. ඊට අමතරව විදේශගතව සිටින ශ්‍රී ලංකාවේ දූත මණ්ඩල කොවිඩ් 19 බලපෑම නිසා ශ්‍රී ලංකාවේ සේවකයන් සහ විභව සංචාරකයන් විසින් සේවා සඳහා කරන ඉල්ලුමේ වැඩි වීමක් සහ පවතින සම්පත් මත වැඩි පීඩනයක් එල්ල වීමක් ද අත්දකින්නට ඇත. සමස්ථයක් වශයෙන් 2021 සමඟ සන්සන්දනය කිරීමේ දී 2022 වසරේ විදේශ කටයුතු අමාත්‍යාංශයට සහ කළාපීය සහයෝගිතාව පිළිබඳ රාජ්‍ය අමාත්‍යාංශයට වෙන් කරන ලද මුදල් වල ආන්තික වර්ධනයක් දැකිය හැකිය. කෙසේ වෙතත් ඉහත සඳහන් කළ පරිදි දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් වෙන් කිරීම් වල සුළු අඩුවීමක් දක්නට තිබෙන අතර ප්‍රතිඵල වල මට්ටමට සෘණ බලපෑමක් ඇති නොවන පරිදි වැඩි මෙහෙයුම් කාර්යක්ෂමතාවකින් කටයුතු කිරීම අවශ්‍ය වනු ඇත.

4.2 ඵලදායී පුරවැසියෙක් (සෞඛ්‍ය) – (VPS 5)

ශ්‍රී ලංකා ආණ්ඩුවේ සෞඛ්‍ය අංශයේ වැය සෞඛ්‍ය අමාත්‍යාංශය සහ වෙනත් රාජ්‍ය අමාත්‍යාංශ තුනක් විසින් දරනු ලබයි. ඒවා නම් 1. දේශීය වෛද්‍ය ප්‍රවර්ධන, ග්‍රාමීය සහ ආයුර්වේද රෝහල් සංවර්ධන සහ ප්‍රජා සෞඛ්‍ය පිළිබඳ රාජ්‍ය අමාත්‍යාංශය , 2. ඖෂධ නිෂ්පාදනය, සැපයීම සහ නියාමන රාජ්‍ය අමාත්‍යාංශය සහ 3) ප්‍රාථමික සෞඛ්‍ය සේවා, වසංගත රෝග හා කොවිඩ් රෝග පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය යි. සෞඛ්‍ය අංශය සඳහා වන අයවැය වෙන්කිරීම වගුව 5 හි දක්වා තිබේ. සෞඛ්‍ය අංශයට කරන ලද මුළු වෙන්කිරීම රු. මිලියන 239,738 ක් වන අතර එය 2022 දළ දේශීය නිෂ්පාදිතයෙන් 1.3% කි. 2021 අදාළ වටිනාකම සමඟ සන්සන්දනය කිරීමේ දී එය අඩුවීමකි. (දළ දේශීය නිෂ්පාදිතයෙන් 1.8%)

සෞඛ්‍ය අංශය සඳහා 2022 වර්ෂයට රජයේ මුළු වෙන්කිරීම ආණ්ඩුවේ මුළු වියදමින් 4.4% කි. ප්‍රතිශතයක් වශයෙන් බලන විට 2021 අදාළ වර්ෂය සමඟ සන්සන්දනය කිරීමේදී එය අඩුවීමකි. (2021 සෞඛ්‍ය අංශය කරන ලද වෙන්කිරීම ආණ්ඩුවේ මුළු වියදමින් 5.7% කි.)

5 වගුව: අමාත්‍යාංශ අතර සෞඛ්‍ය අංශයට වෙන් කර ඇති ප්‍රතිපාදන – 2022 (රු. මිලියන)

අමාත්‍යාංශය/ රාජ්‍ය අමාත්‍යාංශය	වර්තන	ප්‍රාග්ධන	එකතුව
සෞඛ්‍ය අමාත්‍යාංශය	121,529	37,000	158,529
දේශීය වෙදකම් ප්‍රවර්ධන, ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් සංවර්ධන සහ ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යාංශය	2,179	100	2,279
ඖෂධ නිෂ්පාදනය සැපයීම සහ නියාමන රාජ්‍ය අමාත්‍යාංශය	65,730	400	66,130
ප්‍රාථමික සෞඛ්‍ය සේවා, වසංගත රෝග හා කොවිඩ් රෝග පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය	12,650	150	12,800
එකතුව	202,088	37,650	239,738

මූලාශ්‍රය **:** මූල්‍ය වර්ෂය සඳහා විසර්ජන පනත් කෙටුම්පත, 2022 (අයවැය යෝජනා ඇතුලත්වේ 2022)

2 රූපය : සෞඛ්‍ය අංශයේ අයවැය වෙන්කිරීම – 2018-2022



මූලාශ්‍රය : 2020 අනුමත අයවැය ඇස්තමේන්තු, අයවැය ඇස්තමේන්තු (දළ කෙටුම්පත) 2022, විසර්ජන පනත් කෙටුම්පත 2022 (2022 සංඛ්‍යා අයවැය කථාවෙන් වෙන් කරන ලද ප්‍රමාණයන් ද ඇතුළත්ව)

1 රූපයේ දක්වා ඇති පරිදි සෞඛ්‍ය අංශය වෙනුවනේ වෙන් කරන ලද මුළු ප්‍රතිපාදන 2021 සිට 2022 වන විට 20.5%කින් අඩුවී තිබේ. එම අඩුවීම වර්තන සහ ප්‍රාග්ධන යන වියදම් වර්ග දෙකෙහිම දැකිය හැකිය. (වර්තන වියදමේ 21% ක අඩුවීමක් සහ ප්‍රාග්ධන වියදමේ 16% ක අඩුවීමක් තිබේ.)

ශ්‍රී ලංකා ආණ්ඩුවේ ප්‍රතිපත්තිය පදනම්ව සෞඛ්‍ය අංශයේ අයවැය වෙන්කිරීම

මානව ප්‍රාග්ධන සංවර්ධනයේ එක් වැදගත් අංශයක් ලෙස සෞභාග්‍යයේ දැක්ම තුළ සෞඛ්‍ය ක්ෂේත්‍රය හඳුනාගෙන තිබෙන අතර සෞඛ්‍යයේ සෑම මානයක් ම (ශාරීරික, මානසික, සමාජ යහපැවැත්ම සහ ආධ්‍යාත්මික යහපැවැත්ම) එයට ඇතුළත් වේ. සෞභාග්‍යයේ දැක්මට අනුව විශේෂයෙන්ම කොවිඩ් 19 වසංගතයට අදාළ අභියෝග හමුවේ 2022 අයවැය සෞඛ්‍ය සම්පන්න සහ බුද්ධිමත් මානව සම්පත් සංචිතයක් ඇතිකිරීමේ රටකට ඇති වැදගත්කම හඳුනාගෙන තිබේ. 2022 අයවැය තුළින් සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශයෙහි ඇති අරමුණු ඉටුකරගැනීම සඳහා නව වැඩසටහන් කිහිපයක් යෝජනා කර තිබේ. (වගුව 6)

6 වගුව: සෞඛ්‍ය අංශයට කරන ලද වෙන්කිරීම්, ප්‍රතිපත්ති සහ වැඩසටහන් ප්‍රමුඛතාව මත

ප්‍රතිපත්ති ප්‍රමුඛතා	නව යෝජනා සඳහා වෙන් කිරීම්
ළමයින්ගේ ගැටළු සහ මානසික සෞඛ්‍ය සංවර්ධනය සඳහා සෞඛ්‍ය/ දේශීය වෛද්‍ය කටයුතු සංවර්ධනය කිරීම.	ළමා සහ මාතෘ සායන පවත්වන නියෝජිතායතන, ග්‍රාමීය රෝහල්, බෙහෙත් ශාලා, වෛද්‍ය නිලධාරි කාර්යාල, ආයුර්වේද වෛද්‍ය ශාලා, යෝග සහ මානසික සෞඛ්‍ය සායන සඳහා දැනටමත් වෙන් කර තිබෙන රු. මිලියන 32,650/- ට අමතරව රු. මිලියන 5,000/- වෙන් කිරීම.
මාතෘ සහ ළමා පෝෂණය	රු. 10,000/- ක වටිනාකමට සකස් කර ඇති ගර්භණී මව්වරුන්ට දෙන පෝෂණ මල්ල දැනට පවතින මාස 10 ක කාලයේ සිට මාස 24 ක කාලයක් සඳහා දීර්ඝ කරන ලදී. ඒ අනුව පවතින මුදල් වෙන් කිරීම් වලට අමතරව තව රු. මිලියන 1,000/- ක් මේ සඳහා වෙන් කළ යුතුව ඇත.
සෞඛ්‍ය පහසුකම්වල දිස්ත්‍රික් මට්ටමේ හඳුනාගත් විසමතාවන් අවම කිරීම.	සෑම දිස්ත්‍රික්කයකම රෝහලක් ඉදිකිරීම සඳහා ආයෝජකයන් ධෛර්යමත් කිරීමට අවශ්‍ය ඉඩම් සහ බදු සහන ලබා දීම. කෙසේ වෙතත්, මෙම ආරම්භයන් සම්බන්ධයෙන් වන වැඩිදුර තොරතුරු අයවැය තුළ සඳහන් කර නැත.

මූලාශ්‍රය: අයවැය කථාව, 2022

4.3 ඵලදායී පුරවැසියන් (අධ්‍යාපනය) – (VPS 5)

ශ්‍රී ලංකා රජයේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ ප්‍රතිපාදන අධ්‍යාපන අමාත්‍යාංශය (අ.අ) සහ අනෙකුත් රාජ්‍ය අමාත්‍යාංශ සතර වන කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් සහ ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් සහ අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය, නිපුනතා සංවර්ධන, වෘත්තිය අධ්‍යාපන,පර්යේෂණ සහ නව නිර්මාණ රාජ්‍ය අමාත්‍යාංශය, දහම් පාසල්, පිරිවෙන හා භික්ෂු අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශය සහ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, විවෘත විශ්ව විද්‍යාල සහ දුරස්ථ ඉගෙනුම් ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය යන අමාත්‍යාංශ වෙත වෙන්වේ. අමාත්‍යාංශ අතර වෙන්වන අයවැය ප්‍රතිපාදන වල විස්තරාත්මක සංඛ්‍යාලේඛන 7වන වගුවේ දැක්වේ.

අධ්‍යාපනය සඳහා වෙන්කොට ඇති මුලු ප්‍රතිපාදන ප්‍රමාණය (ශ්‍රී.ල.රු.මිලියන 208, 060) 2022 වසරේ ද.දේ.නි. යෙන් 1.1% වේ. එසේම, අධ්‍යාපන ක්ෂේත්‍රය සඳහා වෙන්ව ඇති ප්‍රතිපාදන ප්‍රමාණය අයවැය පංගුවෙන් 3.8% වන අතර එය පසුගිය වසරේ අයවැය පංගුවට සාපේක්ෂව (2021 වසරේදී 3.6% ක් පමණ) මදක් ඉහලය. සමස්තයක් ලෙස 2021 වසරේ ප්‍රතිපාදන සමග සැසඳීමේදී අධ්‍යාපන ක්ෂේත්‍රයේ ප්‍රතිපාදන 13% ක වර්ධනයක් පෙන්නුම් කරන අතර අධ්‍යාපන රේඛීය අමාත්‍යාංශය යටතේ 24% ක වර්ධනයක් යෝජනා කොට තිබේ (7 වන වගුව බලන්න). මෙම ඉහලයාම ගුරු-විදුහල්පති වැටුප් විශමතාවය ඉවත්කිරීම වෙනුවෙන් ශ්‍රී.ල.රු. මිලියන 30,000 ක අමතර ප්‍රතිපාදන වෙන් කිරීම හරහා සිදු වූවකි.

7 වගුව: අධ්‍යාපන ක්ෂේත්‍රයේ ප්‍රතිපාදන, අමාත්‍යාංශය අනුව (ශ්‍රී.ල.රු. මිලියන)

අමාත්‍යාංශය/රාජ්‍ය අමාත්‍යාංශය	2018	2019	2020	2021 ප්‍ර.ඇ	2022 ඇ	2021-2022 % වෙනස
අධ්‍යාපන අමාත්‍යාංශය	126,336	134,431	120,226	130,939	162,905	24
කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් සහ ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් සහ අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය.	343	360	34,082	30,743	23,805	(23)
නිපුනතා සංවර්ධන, වෘත්තිය අධ්‍යාපන, පර්යේෂණ සහ නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය.	-	-	2,149	3,293	2,115	(36)
දහම් පාසල්, පිරිවෙන් සහ භික්ෂු අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශය.	2,077	2,058	12,174	13,878	14,360	3
අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, විවෘත අධ්‍යාපන හා දුරස්ථ ඉගෙනුම් ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය.	-	-	4,529	4,931	4,875	(1)
එකතුව	128,756	136,849	173,160	183,784	208,060	13

සැ.යු: ප්‍ර.ඇ-ප්‍රතිශෝධිත ඇස්තමේන්තුව, ඇ- ඇස්තමේන්තුව

මූලාශ්‍රය: මු.අ විසින් ඉදිරිපත් කරන ලද යාවත්කාලීන කරන ලද 2022 අයවැය ඇස්තමේන්තු: අයවැය ඇස්තමේන්තු 2018-2021.

ශ්‍රී ලංකා රජයේ ප්‍රතිපත්තිය මත පදනම්ව අධ්‍යාපන ක්ෂේත්‍රයේ ප්‍රතිපාදන.

2022 වසරේ අයවැය යෝජනා, ‘‘මානව සම්පත සංවර්ධනය කිරීම තුලින් දැණුම පාදක ආර්ථිකයක්’’ සාක්ෂාත් කර ගැනීම පිලිබඳ සෞභාග්‍යයේ දැක්මෙහි ඇතුලත් ප්‍රතිපත්ති හා බැඳී පවතී. ඒ අනුව, විවිධ මට්ටම් වලදී අධ්‍යාපන ක්ෂේත්‍රය සංවර්ධනය කිරීම සඳහා වන වැඩසටහන් ගණනාවක් සඳහා වූ අතිරේක ප්‍රතිපාදන අයවැය විසින් යෝජනා කර සිටී (8 වන වගුව බලන්න).

සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති සමග යමින්, අධ්‍යාපන ක්ෂේත්‍රයේ පවතින විෂමතාවයන් ඉවත්කිරීමේ වැදගත්කම 2022 අයවැය විසින් හඳුනාගෙන ඇත. ඒ අනුව, ජාතික පාසල් 1,000ක් ඇතිකිරීමේ වැඩසටහන සහ අධ්‍යාපන ක්ෂේත්‍රයේ අනෙකුත් සංවර්ධන කටයුතු සඳහා ශ්‍රී.ල.රු. මිලියන 5,300ක අතිරේක ප්‍රතිපාදන අයවැය විසින් යෝජනා කර සිටී. මෙය බෙහෙවින් සාධනීය ප්‍රතිපාදනයකි. එසේම, සියලු පාසල් ආවරණය වන පරිදි ෆයිබර් ඔප්ටික් තාක්ෂණික සම්බන්ධතා සැපයීම සඳහා ආයෝජනය කිරීමට අයවැය යෝජනා කර සිටී: කෙසේවෙතත්, මෙම වැඩසටහන වෙත අරමුදල් සැපයීම යෝජනා යටතේ සඳහන් කොට නැත. විෂමතාවයන් දුරු කිරීමේ අරමුණ පෙරදැරිව, ප්‍රාදේශීය මට්ටමින් ජාත්‍යාන්තර පාසල් ස්ථාපිත කිරීම සඳහා ආයෝජකයින් දිරිගැන්වීමට ඉඩම් සහ බදු සහන ලබාදීමට අයවැය විසින් යෝජනා කර සිටී. එනමුත්, ජාත්‍යාන්තර පාසල් හරහා ඉහල ගුණාත්මක භාවයකින් යුත් අධ්‍යාපනයක් ලබා ගැනීමට දිළිදු ළමුන් හට එම පාසල් වෙත ප්‍රවේශය ලැබෙන්නේ කෙසේදැයි පැහැදිලි නැත. එසේම, එවන් ජාත්‍යන්තර පාසල් විසින් අපේක්ෂිත ප්‍රමිති මට්ටම් පවත්වා ගෙන යන බව තහවුරු කර ගැනීම සඳහා නියාමනයක් අවශ්‍යය.

නිපුනතා වලින් සපිරි සමාජයක් බිහි කිරීම සඳහා ගුණාත්මක වෘත්තිය හා තාක්ෂණික පුහුණුව අවශ්‍යය.රටේ කාර්මික සහ තාක්ෂණික අධ්‍යාපනයේ ගුණාත්මකභාවය ඉහල දැමීමේ අවශ්‍යතාවය අයවැය විසින් නිවැරදිව හඳුනාගනී. තාක්ෂණික අධ්‍යාපනය ලබාදීමට සහ නාගරික විශ්ව විද්‍යාල ඇතිකිරීමට මෙන්ම පාසල් හැර යන්නන් සඳහා වෘත්තීය පුහුණුව ලබාදීමේ දැනට පවතින පහසුකම්

ඉහල දැමීමට එමගින් අතිරේක ප්‍රතිපාදන වෙන් කරනු ලබයි. වෘත්තිය සහ කාර්මික පුහුණු පහසුකම් ඉහල දැමීම හරහා කුසලතා සපිරි සමාජයක් නිර්මාණය කිරීම වෙත වූ ප්‍රතිපත්තිය ප්‍රශංසාත්මක වූවත් එම අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා වෙන් කොට ඇති ප්‍රතිපාදන සීමාසහිතය. උදාහරණයක් ලෙස, නිපුණතා සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය වෙනුවෙන් යෝජිත අයවැය ප්‍රතිපාදන ප්‍රමාණය පෙර වසරේ ප්‍රතිපාදන වලට වඩා 36% ක් අඩුය (8 වන වගුව බලන්න).

අධ්‍යාපන ක්ෂේත්‍රය සඳහා වූ අතිරේක ප්‍රතිපාදන. පුනරාවර්තන වියදම් යටතේ විශාල වශයෙන් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ලබා දී ඇති තත්වයක් තුල, අධ්‍යාපන ක්ෂේත්‍රය තුල අපේක්ෂිත පහසුකම් සංවර්ධනය කිරීම සඳහා එම ප්‍රතිපාදන ප්‍රමානවත් නොවිය හැකිය. තවද, අධ්‍යාපන ක්ෂේත්‍රය සඳහා 2022 වසර වෙනුවෙන් වෙන් කොට ඇති මූලධන ප්‍රතිපාදන ප්‍රමාණය ශ්‍රී.ල.රු.බිලියන 38 ක් පමණ වේ. මෙම ප්‍රමාණය 2020 වසර සඳහා (ශ්‍රී.ල.රු.බිලියන 46) සහ 2021වසර සඳහා (ශ්‍රී.ල.රු.බිලියන 41) වෙන් කරන ලද ප්‍රමාණයට වඩා අඩුය.

8 වගුව: අධ්‍යාපන ක්ෂෙත්‍රයේ ප්‍රතිපාදන, වැඩසටහන් සහ ප්‍රතිපත්ති ප්‍රමුඛතා අනුව.

ප්‍රතිපත්ති ප්‍රමුඛතාවය	නව යෝජනා සඳහා ප්‍රතිපාදන
පාසල් අධ්‍යාපනය යලි පුබුදුවාලීම.	ජාතික පාසල් නොමැති ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ තුල ජාතික පාසල් 1,000 ක් ඇතිකිරීම සහ ද්විතීයික පාසල්වල පහසුකම් වැඩිදියුණු කිරීම- ශ්‍රී.ල.රු. මිලියන 5,300 ක අතිරේක ප්‍රතිපාදන.
	සියලු පාසල් ආවරණය වන පරිදි ෆයිබර් ඔප්ටික් තාක්ෂණික සබඳතා සැපයීම.
කුසලතා සපිරි සමාජයක් කරා .	කාර්මික හා තාක්ෂණික අධ්‍යාපනය සහ නාගරික විශ්ව විද්‍යාල සඳහා පහසුකම් සපයාදීම සහ පාසල් අධ්‍යාපනයෙන් අනතුරුව වෘත්තීය සහ කාර්මික කුසලතා සඳහා දැනට පවතින පහසුකම් වැඩිදියුනු කිරීම - ශ්‍රී.ල.රු.මිලියන 2,000.
ශක්තිමත් ,සෞඛ්‍ය සම්පන්න සහ විනයවත් ජාතියක් නිර්මාණය කිරීම .	ක්‍රීඩා ගම්මාන, පාසල් ක්‍රීඩා පිට්ටනි සහ ගෘහස්ථ ක්‍රීඩා පහසුකම් සංවර්ධනය කිරීම- ශ්‍රී.ල.රු.මිලියන 3,000.

මූලාශ්‍රය: අයවැය කථාව 2022.

3 රූප සටහන: අධ්‍යාපන ක්ෂේත්‍රයේ අයවැය ප්‍රතිපාදන- 2018-2022



මූලාශ්‍රය: මු.අ. විසින් ඉදිරිපත් කරන ලද 2022 යාවත්කාලීන කරන ලද අයවැය සහ 2018-2021 අයවැය ඇස්තමේන්තු මත පදනම් වූ IPS සම්පාදනය.

9 වගුව: තරුණ සහ ක්‍රීඩා ක්ෂේත්‍රයේ ප්‍රතිපාදන, අමාත්‍යාංශය අනුව (ශ්‍රී.ල.රු. මිලියන)

අමාත්‍යාංශය/ රාජ්‍ය අමාත්‍යාංශය	**2018**	**2019**	**2020**	**2021 සං.ඇ.**	**2022 ඇ.**	**2021-2022 % වෙනස**
තරුණ හා ක්‍රීඩා කටයුතු අමාත්‍යාංශය	5,962	4,397	5,939	11,764	8,574	(27)
ග්‍රාමීය සහ පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය	0	0	956	3,370	1,867	(45)
එකතුව	5,962	4,397	6,895	15,134	10,440	(31)

මූලාශ්‍රය: මු.අ. විසින් ඉදිරිපත් කරන ලද යාවත් කාලීන කරන ලද 2022 අයවැය; 2018-2021 අයවැය ඇස්තමේන්තු.

ග්‍රාමීය ක්‍රීඩා පහසුකම්, පාසල් ක්‍රීඩා පිට්ටනි සහ ගෘහස්ථ ක්‍රීඩා පහසුකම් සංවර්ධනය කිරීම සඳහා රු. මිලියන 3,000 ක අතිරේක ප්‍රතිපාදන අයවැය විසින් යෝජනා කර සිටී. එය සෞ.දැ. ප්‍රතිපත්තියේ ඇති ශක්තිමත්, සෞඛ්‍ය සම්පන්න සහ විනයවත් ජාතියක් නිර්මාණය කිරීමේ කාර්යය හා බද්ධ වූවකි. එතකුදු වුවත්, 2021 වසරේ අයවැය ප්‍රතිපාදන (9 වන වගුව බලන්න) වලට සාපේක්ෂව 2022 වසරේ ප්‍රතිපාදන 30% කින් පමණ අඩුය.

4.4 ආර්ථික සංවර්ධනය (කර්මාන්ත) – (VPS 6)

10 වැනි වගුවේ දැක්වෙන ආකාරයට, කර්මාන්ත අංශයේ අරමුදල්, කර්මාන්ත අමාත්‍යාංශය, උක්, බඩ ඉරිඟු, කජු, ගම්මිරිස්, කුරුඳු, කරාබුනැට්, බුලත් ඇතුළු කුඩා වැවිලි භෝග වගා සංවර්ධනය ආශ්‍රිත කර්මාන්ත හා අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය, බතික්, අත්යන්ත්‍ර රෙදි හා දේශීය ඇඟළුම් නිෂ්පාදන රාජ්‍ය අමාත්‍යාංශය, වේවැල්, පිත්තල, මැටි, ලී බඩු සහ ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය, මැණික් හා ස්වර්ණාභරණ ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශය සහ සංචාරක

අමාත්‍යාංශය විසින් උපයෝජනය කරනු ලැබේ. කර්මාන්ත අංශයේ මුළු අයවැය මුදල් වෙන් කිරීම රු.මිලියන 15,251 ක් වන අතර එය 2022 ද.දේ.නි.න් 0.082% කි. 2021 වර්ෂයේදී කර්මාන්ත අංශයේ අයවැය මුදල් වෙන් කිරීම ද.දේ.නි. හි ප්‍රතිශතයක් ලෙස 0.075%ක් විය.මෙය 2022 වර්ෂය තුළ ද.දේ.නි. හි ප්‍රතිශතයක් ලෙස ආන්තික වැඩිවීමක් පෙන්නුම් කරයි.

10 වගුව: අමාත්‍යාංශ අනුව කර්මාන්ත අංශයේ අයවැය මුදල් වෙන් කිරීම (ශ්‍රී ලංකා රුපියල් මිලියන)

අමාත්‍යාංශය/ රාජ්‍ය අමාත්‍යාංශය	**පුනරාවර්තන**	**ප්‍රාග්ධන**	**එකතුව**
කර්මාන්ත අමාත්‍යාංශය	1,142	6,500	7,642
උක්, බඩ ඉරිඟු, කජු, ගම්මිරිස්, කුරුඳු, කරාබුනැට්, බුලත් ඇතුළු කුඩා වැවිලි භෝග වගා සංවර්ධනය, ආශ්‍රිත කර්මාන්ත හා අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය	1,246	1,400	2,646
බතික්,අත්යන්ත්‍ර රෙදි හා දේශීය ඇඟළුම් නිෂ්පාදන රාජ්‍ය අමාත්‍යාංශය	535	1,225	1,760
වේවැල්, පිත්තල, මැටි, ලී බඩු සහ ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය, මැණික් හා ස්වර්ණාභරණ ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශය	939	1, 150	2,089
මැණික් හා ස්වර්ණාභරණ ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශය	161	30	191
සංචාරක අමාත්‍යාංශය	678	244	923
එකතුව	4,701	10,549	15,251

මූලාශ්‍රය: 2022 මුදල් වර්ෂය වෙනුවෙන් විසර්ජන පනත් කෙටුම්පත

2022 වර්ෂය තුළ මුළු අයවැය මුදල් වෙන් කිරීම රු.මිලියන 15,251 වන අතර එය පෙර වර්ෂය හා සැසඳීමේදී ආසන්න වශයෙන් 23% ක වර්ධනයක් පෙන්නුම් කරයි. 2021 වර්ෂය තුළ පුනරාවර්තන වියදම ද.දේ.නි. හි ප්‍රතිශතයක් ලෙස 0.029 ක් වූ අතර ප්‍රාග්ධන වියදම ද.දේ.නි.හි ප්‍රතිශතයක් ලෙස 0.046 ක් විය**.** 2022 වර්ෂයේදී මෙවා පිළිවෙලින් 0.025% ක් සහ 0.057% ක් වීම අපේක්ෂිතය.

ශ්‍රී ලංකා රජයේ ප්‍රතිපත්තිය මත පදනම්ව කර්මාන්ත අංශයේ මුදල් වෙන් කිරීම

සෞභාග්‍යයේ දැක්මෙහි සඳහන් ආකාරයට කුඩා සහ මධ්‍ය පරිමාණ කර්මාන්ත දියුණු කිරීමේ වැදගත්කම 2022 වර්ෂය වෙනුවෙන් අයවැය යෝජනා හඳුනාගෙන ඇත. අත්යන්ත්‍ර රෙදි සහ බතික් ඇතුළුව විශේෂයෙන්ම ගෘහ සහ රෙදිපිළි කර්මාන්ත සංවර්ධනය වෙනුවෙන් නව යෝජනා දෙකක් හඳුන්වා දෙනු ලැබ ඇත. කුඩා සහ මධ්‍ය පරිමාණ කර්මාන්ත කලාප සංවර්ධනය පිණිස ශ්‍රී ලංකා රුපියල් මිලියන 5,000 ක් වෙන් කර තිබේ. ජාතික නිෂ්පාදනය කර්මාන්ත අංශයේ දායකත්වය වැඩි කිරීම පිණිස නව නිෂ්පාදන ආයෝජන කලාප සංවර්ධනය වෙනුවෙන් යටිතල පහසුකම් සංවර්ධනය කිරීම 2022 අයවැය යෝජනා කරන අතර මෙය සෞභාග්‍යයේ දැක්මෙහි ඇතුළත්ව ඇති යෝජනාවක්ද වේ.

11 වගුව: කර්මාන්ත අංශය වෙනුවෙන් අයවැය මුදල් වෙන් කිරීම, ප්‍රතිපත්ති ප්‍රමුඛතාව සහ වැඩසටහන අනුව

ප්‍රතිපත්ති ප්‍රමුඛතාව	නව යෝජනා වෙනුවෙන් මුදල් වෙන් කිරීම්
එකතු කළ අගය සහිත කුඩා සහ මධ්‍ය පරිමාණ කර්මාන්ත	ගෘහ කර්මාන්ත සංවර්ධනය – ශ්‍රී ලංකා රුපියල් මිලියන 1,000
	අත් යන්ත්‍ර රෙදි සහ බතික් ඇතුළුව රෙදිපිළි කර්මාන්ත සංවර්ධනය – ශ්‍රී ලංකා රුපියල් මිලියන 1,000
	කුඩා සහ මධ්‍ය පරිමාණ කර්මාන්ත කලාප – ශ්‍රී ලංකා රුපියල් මිලියන 5,000
ව්‍යාපාරික ප්‍රජාව වෙනුවෙන් සහෝපකාරී ව්‍යාපාර පරිසරයක් නිර්මාණය කිරීම	නව නිෂ්පාදන ආයෝජන කලාප වෙනුවෙන් යටිතල පහසුකම් සංවර්ධනය කිරීම – ශ්‍රී ලංකා රුපියල් මිලියන 5,000

මූලාශ්‍රය: අයවැය කථාව 2022.

4.5 ආර්ථික සංවර්ධනය (කෘෂිකර්මාන්තය) – (VPS 6)

භෝග, පශු සම්පත්, වැවිලි සහ ධීවර යන කෘෂිකර්මාන්තය පාදක කරගත් අංශ වල කටයුතු ආයතන ගණනාවක් විසින් ඉටු කරනු ලැබේ. අයවැය මුදල් වෙන් කිරීම් අමාත්‍යාංශ සහ රාජ්‍ය අමාත්‍යාංශ ගණනාවක් අතර බෙදී යයි (12 වගුව බලන්න)[1]. විශ්ලේෂණයෙහි පහසුව වෙනුවෙන්, මෙම අංශ පහත දැක්වෙන ආකාරයට කාණ්ඩ වලට වෙන් කෙරේ: භෝග සහ පශු සම්පත්, වැවිලි සහ ධීවර, තේ, රබර්, පොල් වැනි ප්‍රධාන වැවිලි අපනයන භෝග කටයුතු සාම්ප්‍රදායිකව වෙනම අමාත්‍යාංශ මගින් සිදු කෙරෙන බැවින් භෝග යන්නෙන් වැවිලි නොවන භෝග සඳහන් කෙරේ. මෙම අංශ, විසර්ජන පනත් කෙටුම්පතේ මුදල් වෙන්කිරීම් වලින් 3.12% ක් පමණක් ලැබී ඇති 'ජනතා කේන්ද්‍රීය ආර්ථික සංවර්ධනය' ශ්‍රී ලංකා රජයේ ප්‍රතිපත්ති ක්ෂේත්‍රය යටතට පැමිණේ.

12 වගුව. කෘෂිකර්මාන්තය පාදක කරගත් අංශ වලට අයවැය මුදල් වෙන් කිරීම් 2022 (ශ්‍රී ලංකා රුපියල් මිලියන)

අංශය	අමාත්‍යාංශය	පුනරාවර්තන	ප්‍රාග්ධන	එකතුව
කෘෂිකර්මාන්තය (භෝග සහ පශු සම්පත්)	කෘෂිකර්ම අමාත්‍යාංශය	16,248	23,557.1	33,395.1
	ගෘහාශ්‍රිත සත්ත්ව පාලන හා සුළු ආර්ථික භෝග ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය	233.3	292	525.3
	වී සහ කාබනික පොහොර රාජ්‍ය අමාත්‍යාංශය	43,582.22	2,216	45,798.22
	පශු සම්පත් රාජ්‍ය අමාත්‍යාංශය	973.1	1,800	2,773.1
වැවිලි	වැවිලි අමාත්‍යාංශය	990	10,059	11,049
	සමාගම් වතු ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍යාංශය	1,405	2,300	3,705
	පොල් රාජ්‍ය අමාත්‍යාංශය	948	600	1,548
	කුඩා වැවිලි භෝග සංවර්ධන අමාත්‍යාංශය	1,246	1,400	2,646
ධීවර	ධීවර අමාත්‍යාංශය	871.9	1,300	2,171.9
	විසිතුරු මසුන් හා මිරිදිය මත්ස්‍ය රාජ්‍ය අමාත්‍යාංශය	1,456.45	375	1,831.45
එකතුව		62,698	41,001	103,700

මූලාශ්‍රය: 2022 මුදල් වර්ෂය වෙනුවෙන් විසර්ජන පනත් කෙටුම්පත.

[1] පසුගිය වර්ෂය හා සැසඳූ කළ , වී රාජ්‍ය අමාත්‍යාංශය සහ පොහොර රාජ්‍ය ඒකාබද්ධ කිරීම සහ ගෘහාශ්‍රිත සත්ව පාලන හා සුළු ආර්ථික භෝග ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය නිර්මාණය කිරීම කරන ලදුව අමාත්‍යාංශ ව්‍යුහයේ සුළු වෙනස්කමක් ඇත.

4.5.1 කෘෂිකාර්මික භෝග සහ පශු සම්පත්

2022 වර්ෂයේ මෙම අංශය වෙනුවෙන් අයවැය මුදල් වෙන් කිරීම් වල ස්වල්ප දියුණුවක් ඇත. අමාත්‍යාංශයට සහ රාජ්‍ය අමාත්‍යාංශ තුනට වෙන්කිරීම් 2020 අයවැය වෙන් කිරීම් වල සිට සාමූහික වශයෙන් 1.7% කින් පමණක් වැඩි දියුණු වී ඇත. තවද, වී සහ පොහොර රාජ්‍ය අමාත්‍යාංශය සහ පශු සම්පත් අමාත්‍යාංශය වෙත වියදම් වෙන් කිරීම් අඩු වී ඇත. පුනරාවර්තන වියදම් වෙන් කිරීම අඩු වී තිබියදීත්, ප්‍රාග්ධන වියදම් වෙන්කිරීම් වල කැපී පෙනෙන වර්ධනය නිසා කෘෂිකර්ම අමාත්‍යාංශ වෙත සමස්ත වෙන් කිරීම් 38.6% කින් වර්ධනය වී තිබේ. එමෙන්ම, කෘෂිකාර්මික භෝග සහ පශු සම්පත් මුළු වියදම් අයවැයෙන් 0.6% ක් අළුතින් නිර්මාණය කරන ලද ගෘහාශ්‍රිත සත්ත්ව පාලන හා සුළු ආර්ථික භෝග ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය වෙත වෙන් කරනු ලැබ ඇත.

තවද, විෂ රහිත වල් නාශක භාවිතය වෙනුවෙන් හෙක්ටයාරයකට රු.5,000 ක ප්‍රදානයක් / නව තාක්ෂණය හඳුන්වාදීම වෙනුවෙන් රු. මිලියන 5,000 වැනි භෝග අනු අංශයට අදාල යෝජනා ගණනාවක් 2022 අයවැය කථාව සඳහන් කරයි. එමෙන්ම, කාබනික පොහොර සහ පලිබෝධ නාශක නිෂ්පාදනය ආරම්භ කිරීමට කාරක ප්‍රාග්ධනය සැපයීමට රු.මිලියන 35,000 ක සහ නව තාක්ෂණය වෙනුවෙන් රු.මිලියන 17,005 ක තවදුරටත් මුදල් වෙන් කිරීම් විසර්ජන පනත් කෙටුම්පත තුළ වේ. රු. මිලියන 1,000 ක වැය වෙන් කිරීමක් සමඟ පශු සම්පත් අංශය තුළ ආයෝජන තවදුරටත් වැඩි කිරීම වෙනුවෙන් යෝජනා ඉදිරිපත් කරනු ලැබ ඇත. කෙසේවෙතත්, ගුණාත්මක වර්ග/ අභිජනන ක්‍රම සහ සත්ව ආහාර ගැටළුව ආවරණය කිරීමට ප්‍රතිපාදන ආයෝජන වලට ඇතුළත්ද යන්න පැහැදිලි නැත.

4 රූප සටහන: භෝග සහ පශු සම්පත් අංශය වෙනුවෙන් අයවැය වෙන් කිරීම



මූලාශ්‍රය:2021 සහ 2022 මූල්‍ය වර්ෂවල විසර්ජන පනත් කෙටුම්පත්

පොහොර සහ උසස් තාක්ෂණය භාවිතා කිරීම තුළ විප්ලවීය වෙනසක් ඇති කිරීම තුළින් ආරක්ෂිත සහ පෝෂ්‍යදායී ආහාර සඳහා ජනතාව සතු අයිතිවාසිකම තහවුරු කරමින් සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශනය හා සමඟ ගැලපෙන ලෙස 2022 අයවැය යෝජනා සකස් කරනු ලැබ ඇත. වසර 10ක කාල පරිච්ඡේදයක් තුළ කාබනික පොහොර භාවිතා කිරීම සඳහා සමස්ත ශ්‍රී ලාංකීය කෘෂිකර්මාන්තය ධෛර්යමත් කිරීම සඳහා කාබනික පොහොර නිෂ්පාදනය කඩිනම් කිරීම සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශනයෙහි දිශානතිය විය. මෑතකදී රසායනික පොහොර සහ කෘෂි රසායන ද්‍රව්‍ය තහනම් කිරීම සඳහා එළඹෙන ලද කඩිනම් ප්‍රවේශය සලකා බැලීමේදී, කාබනික පොහොර, වල් නාශක සහ පලිබෝධ නාශක දේශීය වශයෙන් නිෂ්පාදනය කිරීම සඳහා 2022 අයවැය යෝජනා තුළ වැඩි ප්‍රමුඛතාවයක් ලබා දීම සහ භෝග කෘෂිකර්මය සඳහා දරනු ලබන වියදමින් විශාලතම කොටස වී හා කාබනික පොහොර රාජ්‍ය අමාත්‍යාංශය වෙත වෙන් කර දීම යන කරුණු තේරුම් ගත හැකිය.

එසේවුවද, කාබනික කෘෂිකර්ම ප්‍රවර්ධන වැඩසටහනෙහි වැදගත් අංගයන් වන කාබනික කෘෂිකර්මය පිළිබඳ පර්යේෂණ හා සංවර්ධන කටයුතු, කාබනික කෘෂිකර්මය පුළුල් කිරීම, එහි ප්‍රතිඵල සහ

සහතිකකරනය යන අංගයන් සඳහා ප්‍රතිපාදන දක්නට නොලැබේ. එලෙසම, එමගින් ශ්‍රී ලංකා රජයේ ප්‍රතිපත්තීමය ප්‍රමුඛතාවයන් හා සමගාමීව වියදම් විෂයයන් පිළිබඳව සඳහන් කරනු නොලබන අතර විශේෂ භෝග නිෂ්පාදන කටයුතු සහ තාක්ෂණයන් සඳහා අයවැය තුළ වියදම් විෂයයන් වෙන් කිරීම සිදු වී නොමැත. එසේහෙයින්, කාබනික පොහොර ප්‍රවර්ධනය කිරීමේ දී මෙන්ම තාක්ෂණය හඳුන්වා දීමේ දී මෙම අංශය තුළ වැඩි ප්‍රතිපත්තීමය අවධානයක් යොමු කිරීම අවශ්‍ය වේ. එලෙසම, 2022 අයවැය මගින් ප්‍රමාණවත් ලෙස අවධානය යොමු කරනු ලැබ නොමැති, ගුණාත්මකභාවය සහිත බීජ ලබා ගැනීමට ඇති ඉඩ ප්‍රස්ථාවය අඩු වීම, දේශගුණික ව්‍යසනයන්, භෝග වලට සතුන් විසින් සිදු කරනු ලබන හානි සහ අලෙවිකරන ගැටළු වැනි ගැටළු පිළිබඳව අවධානය යොමු කිරීම සඳහා කෘෂිකාර්මික අගය දාමය පුරාම වැඩි දියුනු කිරීම් සිදු කිරීමේ අවශ්‍යතාවය කොවිඩ්-19 හා ආශ්‍රිත රට අගුළු දැමීම සිදු කරන ලද කාලය තුළ සහ ඉන් අනතුරුව මෙම අංශය විසින් මුහුන දෙන ලද ගැටළු මගින් පෙන්නුම් කරනු ලැබේ.

4.5.2 වැවිලි අංශය

වැවිලි අංශය සඳහා වෙන් කර ඇති අයවැය ප්‍රතිපාදන වල සුවිශේෂී වැඩි වීමක් සිදු වී ඇති අතර එය භෝග සහ පශු සම්පත් කෘෂිකාර්මික අංශය සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණයට වඩා බෙහෙවින්ම වැඩි අගයක් ගනී. අයවැය තුළ මෙම අංශය සඳහා වෙන් කර දී ඇති වියදම් විෂයය, නැවත වගා කිරීම, පාළු සිටුවීම, නව වගාවන්, ජල සම්පාදනය ඉහළ නැංවීම සහ වැවිලි අංශය නවීකරණය කිරීමේ අරමුණ ඇතුව විදේශීය විනිමය ඉපැයීම් ඉහළ නැංවීම සඳහා පුද්ගලික ආයෝජන දිරිමත් කිරීම සහ මෙම අංශය සඳහා සහනාධාර ලබා දීම වැනි කටයුතු සඳහා වන රුපියල් මිලියන 10,000ක අතිරේක ප්‍රතිපාදනයකි. මෙය රටෙහි ප්‍රධානතම අපනයන ආදායමක් වන බව සැළකීමේ දී මෙය සුවිශාල පියවරක් වන අතර සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශනයෙහි නිශ්චිතව දක්වා ඇති පරිදි ආනයනයන් වෙත අඩුවෙන් රඳා පවතින අපනයනයන් තුළින් වෙළඳ හිගය අඩු කිරීම කෙරෙහි රජය විසින් අවධානය යොමු කරනු ලැබේ. එලෙසම, වැවිලි සමාගම් විසින් හිමිකාරිත්වය දරනු ලබන ඉඩම් භාවිතය සම්බන්ධයෙන් වන නව නීති හඳුන්වා දීම සඳහා යෝජනාවක් ඇති අතර,එමගින් කර්මාන්තය වෙත ඇති කරනු ලබන අහිතකර බලපෑම් අවම කිරීම සඳහා සියළුම පාර්ශවකරුවන් සමඟ සාකච්ඡාකර එය සිදුකළ යුතු වේ.

5 රූප සටහන: වැවිලි අංශය සඳහා අයවැය ප්‍රතිපාදනය



මූලාශ්‍රය: 2021 සහ 2022 මූල්‍ය වර්ෂවල විසර්ජන පනත් කෙටුම්පත්

4.5.3 ධීවර අංශය

සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශනයෙහි පැහැදිලිව දක්වා ඇති පරිදි ජනතාව වෙත පෝෂණය ලබාදීම, ආහාර සුරක්ෂිතතාවය ඇති කිරීම, විදේශ විනිමය ඉපැයීම, රැකියා සහ ජීවනෝපාය අවස්ථාවන් ලබා දීම, දිළිඳු බව පිටුදැකීම සහ ජාතික සහ ග්‍රාමීය ආර්ථිකය වෙත විශාල දායකත්වයක් ලබා දීම යන කරුණු සඳහා ධීවර අංශය ශක්තිමත් කිරීම ශ්‍රී ලංකා රජයෙහි ප්‍රධානතම ප්‍රමුඛතාවයක් වේ. කෙසේ වුවද මෙම අංශය වෙත ලබාදී ඇති ප්‍රතිපාදන පසුගිය වර්ෂයේ සිට 50% කින් අඩුවී ඇත. වියදම් යෝජනා තුළ දක්වා ඇති එකම ප්‍රතිපාදනය වන්නේ ධීවර සහ ජල ජීවී වගා සංවර්ධන කටයුතු සඳහා රුපියල් මිලියන දාහක් වෙන්කිරීමකි. අයවැය කතාව ප්‍රකාරව සැකසූ මාළු, කරවල, උම්බලකඩ සහ ටින් මාළු නිෂ්පාදනය දිරිමත් කිරීම උදෙසා වන සමුද්‍රික ධීවර කටයුතු සඳහා ලබාදෙන පහසුකම් පුළුල් කිරීම සහ මිරිදිය ජලාශයන්ට මාලු පැටවුන් මුදාහැරීම යන කාර්යයන් සඳහා මෙම ප්‍රතිපාදන ප්‍රමාණය යොදා ගනු ලැබිය හැකිය. මෙම අංශය වෙත ලබා දෙනු ලබන අයවැය ප්‍රතිපාදනය අඩු වී තිබුණ ද මත්ස්‍ය ගහණය වැඩි දියුණු කිරීම සඳහා විද්‍යාත්මක ක්‍රම හඳුන්වා දීම සඳහා සහ ධීවර වරායන් හා ධීවර යාත්‍රා පහසුකම් නවීකරණය කිරීම සඳහා සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශනය තුළ ලබා දී ඇති පොරොන්දු සමග ඉහත කී යෝජනා අනුගත වේ.

6 රූප සටහන: ධීවර ක්ෂේත්‍රය සඳහා අයවැය ප්‍රතිපාදනය



මූලාශ්‍රය: 2021 සහ 2022 මූල්‍ය වර්ෂවල විසර්ජන පනත් කෙටුම්පත්

4.6 සමාජ සුභසාධනය/ ආරක්ෂාව/ කාන්තාවන් හා ළමයින් - (VPS 5)

(1) සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයෙහි සහ (2) කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශයෙහි අයවැය මෙම කොටස තුල මූලික වශයෙන් විශ්ලේෂණය කරනු ලැබේ

4.6.1 සමාජ සුභසාධනය- සමෘද්ධි රාජ්‍ය අමාත්‍යාංශය

ශ්‍රී ලංකා රජයෙහි මූලික සමාජ ආරක්ෂණ වැඩපිළිවෙළ වන සමෘද්ධි වැඩසටහන සමෘද්ධි, ගෘහආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ (මෙහි මින්පසු සමෘද්ධි අමාත්‍යාංශය යැයි කියනු ලබන) විෂය පථය තුළට අයත් වේ. සමෘද්ධි දෙපාර්තුමේන්තුවෙහි අයවැය අමාත්‍යාංශයෙහි අයවැය තුළ ඇතුළත් වන අතර එය මෙම රාජ්‍ය අමාත්‍යාංශයෙහි අයවැයෙහි

විශාලතම කොටසට හිමිකම් කියයි. මීට අමතරව, වකුගඩු රෝගීන්හට ආධාර ලබාදීම, අඩු ආදායම්ලාභී ආබාධිත තැනැත්තන් සඳහා මූල්‍ය ආධාර සහ වෙනත් සහාය ලබාදීම සහ ග්‍රාම ශක්ති වැඩසටහන වැනි සංවර්ධන වැඩසටහන් ඇතුළත් සුබසාධන වැඩසටහන් ගණනාවක් ආවරණය කරනු ලබන සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයෙහි අයවැය ද මීට ඇතුළත් වේ.

13 වගුව: 2019 සිට 2022 දක්වා සමෘද්ධි අමාත්‍යාංශයෙහි ප්‍රතිපාදන (ශ්‍රී ලංකා රුපියල් මිලියන)

	2019	**2020 සංශෝධිත) අයවැය)**	**2021 (ඇස්තමේන්තු ව)**	**2022 (වාර්ෂික අයවැය අනුව)**	**ඉකුත් වර්ෂ හා සංසන්දනාත්මක වෙනස (2021 - 2022)**	**වර්ධන අනුපාතය**
වියදම් සාරාංශය	58,674	113,756	84,717	75,029	(- 9,688)	-11.44%
රජයේ අයවැයෙහි කොටස් කොටසක් ලෙස	1.44%	2.41%	1.68%	1.46%	-0.22%	-
දළ දේශීය නිෂ්පාදිතයෙහි කොටසක් ලෙස	0.39%	0.71%	0.51%	0.41%	-0.11%	-

මූලාශ්‍රය: 2021 අයවැය ඇස්තමේන්තු සහ 2022 විසර්ජන පනත් කෙටුම්පත

සටහන: සමෘද්ධි අමාත්‍යාංශය පිහිටුවන ලද්දේ 2020 වර්ෂයේ දී වන අතර එසේ හෙයින් මෙහි 2019 අයවැය තුළ අන්තර්ගත වන්නේ සමෘද්ධි දෙපාර්තමේන්තුවෙහි සම්පූර්ණ අයවැය පමණක් වේ.

අයවැය විශ්ලේෂණය

2022 වර්ෂයේදී, සමෘද්ධි රාජ්‍ය අමාත්‍යාංශය සඳහා වන අයවැය ඇස්තමේන්තුව රු. මිලියන 75,029 කි. මෙම අමාත්‍යාංශයේ අයවැයෙන් වැඩි කොටසක් වර්ෂිකව වෙන් කරනු ලබන්නේ සමෘද්ධි දෙපාර්තමේන්තුවටයි. (2022 අයවැය ඇස්තමේන්තු කෙටුම්පත අනුව මෙය 2022 දී 89% ක් පමණ වනු ඇති බවට තක්සේරු කොට ඇත.)

2021 මට්ටම හා සාපේක්ෂව බැලූ කල රාජ්‍ය අමාත්‍යාංශය සඳහා වන සමස්ත අයවැය ඇස්තමේන්තුව රු. බිලියන 9.7 ක පමණ අඩුවීමක් පෙන්වා ඇත. (11.4% ක අඩුවීමක්) අමාත්‍යාංශයේ පුනරාවර්තන සහ ප්‍රාග්ධන වියදම් අයවැය තුළ මෙම පහළ යාම නිරීක්ෂණය වේ. විශේෂයෙන්ම, ප්‍රාග්ධන වියදම් සඳහා වන අයවැය 2021 වසරේ රුපියල් මිලියන 6,317 සිට 2022 වසරේදී රු. මිලියන 1,166 දක්වා සැලකිය යුතු අයුරින් පහළ ගොස් ඇත. මේ සඳහා ප්‍රධාන වශයෙන්ම හේතු වූ කාරණය වශයෙන් සැලකිය හැක්කේ 2021 වසරේදී සෞභාග්‍යා ජාතික ගම්මාන සවිබලගැන්වීමේ වැඩසටහන සඳහා අයවැය ප්‍රතිපාදන වැය කිරීමයි. (සහ 2021 වසරේදී සමෘද්ධි ප්‍රතිලාභී පවුල් 200,000 සඳහා ඒකාබද්ධ නිවාස වැඩසටහන ක්‍රියාත්මක කිරීමයි.[2]).

[2] 2022 අයවැය ඇස්තමේන්තු කෙටුම්පත

7 රූපසටහන: සමෘද්ධි රාජ්‍ය අමාත්‍යාංශය සඳහා අයවැය ප්‍රතිපාදන වෙන් කිරීම – 2019-2022



මූලාශ්‍රය : 2021 අයවැය ඇස්තමේන්තු සහ 2022 විසර්ජන පනත් කෙටුම්පත

අයවැය යෝජනා සහ නිරීක්ෂණ

2022 අයවැය මඟින් සමෘද්ධි ව්‍යාපාරය සඳහා ප්‍රතිසංස්කරණ ගණනාවක් යෝජනා කොට ඇත.:

(i) සමෘද්ධි ව්‍යාපාරය හුදෙක් දිළිඳු සහන වැඩසටහනකට සීමා නොකොට, නවීන ප්‍රවණතාවයන් සමඟ ඒකාබද්ධ වෙමින් ආර්ථික පුනරුදය සහ ආහාර සුරක්ෂිතතාවය සහතික කරනු ලබන ග්‍රාමීය සංවර්ධන ව්‍යාපාරයක් බවට එය පරිවර්තනය කිරීමේ අවශ්‍යතාවය 2022 අයවැය මඟින් යෝජනා කරනු ලැබේ.

(ii) තර්කානුකූල සහ විද්‍යාත්මක යාන්ත්‍රණයක් යටතේ සමාජ සුබසාධන හා සහාය වැඩසටහන් සඳහා ප්‍රතිලාභීන් තෝරා ගැනීමට යෝජනා කරනු ලැබේ.

(iii) ක්ෂුද්‍ර සහ කුඩා ව්‍යවසායන් සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය මූල්‍යමය පහසුකම් සහ මූල්‍ය උපදෙස් ඇතුළුව සියලුම පහසුකම් සහ සේවා එකම තැනකින් සපයනු ලබන මධ්‍යස්ථානයක් බවට සමෘද්ධි බැංකු පරිවර්තනය කිරීමට 2022 අයවැය මඟින් යෝජනා කොට ඇති අතර එහි අරමුණ වනුයේ සමෘද්ධි බැංකු ව්‍යාපාරය ප්‍රතිව්‍යුහගත කිරීමයි.

මෙම සියළුම ක්‍රියාමාර්ග සමෘද්ධි වැඩසටහන වැඩි දියුණු කිරීම සඳහාත් එහි ප්‍රතිඵල අඩු ආදායම් උපයන පවුල් සඳහා වැඩිපුර ලබා දීම සඳහාත් වන වැදගත් පියවරක් සැලකිය හැකිය. විශේෂයෙන්ම, තර්කානුකූල සහ විද්‍යාත්මක යාන්ත්‍රණයක් යටතේ සමෘද්ධි වැඩසටහන සඳහා ප්‍රතිලාභීන් තෝරාගැනීමේ යෝජනාව මඟින් සමෘද්ධි මුදල් සහාය වැඩසටහන තුළ දැනට පවත්නා අඩුපාඩු අවම කර ගැනීමටත්, ඒ මඟින් එහි පිරිවැය පහළ හෙළීමටත් සහාය විය හැකිය.

කෙසේ වුවද, අයවැය තුළ සමෘද්ධි වැඩසටහන සඳහා යෝජනා කොට ඇති ප්‍රතිසංස්කරණ ත්‍රිත්වය සම්බන්ධයෙන් වන කිසිදු අයවැය ප්‍රතිපාදන වෙන් කිරීමක් පිළිබඳව 2022 අයවැය තුළ සඳහන් වී නොමැත.

14 වගුව: ලෝක වසංගතයෙන් බලපෑමට පත් වූවන් ඇතුළුව අවදානම් පාත්‍රතාවයේ සිටින කණ්ඩායම් වල සුභසාධනය වැඩි දියුණු කිරීම සඳහා වන අනෙක් අයවැය යෝජනා

ප්‍රතිපත්ති ප්‍රමුඛතාවය	අයවැය යෝජනා	අයවැය ප්‍රතිපාදන වෙන් කිරීම් (ශ්‍රී ලංකා රුපියල් මිලියන)
ආබාධ සහිත පුද්ගලයන් සඳහා සහාය සැලසීම + ගෞරවාන්විත ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සහිත සමාජයක්	අපගේ ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සහ විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන් සඳහා පහසුකම් සැලසීම ආබාධ සහිත පුද්ගලයන්ගේ අයිතිවාසිකම් පිළිබඳ පනතක් හඳුන්වාදීම සහ ඔවුන්ගේ කුසලතා සහ ව්‍යවසාය සංවර්ධනය සඳහා වැඩසහටනක් දියත් කිරීම	1,000 අයවැය යෝජනා තුළ ප්‍රතිපාදන වෙන් කිරීමක් නැත.
- ආපදා හේතුවෙන් ඇතිවන පීඩාකාරී බවින් මිදීම සඳහා දිළිඳු ජනතාවට සහායවීමට ක්‍රියාකාරී වැඩසටහනක් (පුද්ගල කේන්ද්‍රීය ආර්ථිකයක් යටතේ)	ග්‍රාම නිලධාරී කොට්ඨාශ මට්ටමින් හඳුනාගත් ආර්ථික වශයෙන් දිළිඳු පවුල් සඳහා සහන මල්ලක් සැපයීම	15,000
කාන්තාවන්ගේ ආර්ථික සහ සමාජීය දායකත්වය	ග්‍රාම නිලධාරී කොට්ඨාශ මට්ටමින් කාන්තා ව්‍යවසායිකාවන් සඳහා කුඩා සුපිරි වෙළඳසැල් වැඩසටහන්	15,000
මන්දපෝෂණය ආමන්ත්‍රණය කිරීම සඳහා පෝෂණ වැඩසටහන් හඳුන්වාදීම	ගර්භනී මව්වරුන්ට පෝෂණ මල්ල සැපයීම දැනට තිබෙන මාස 10 සිට මාස 24ක කාලසීමාවක් දක්වා වැඩි කිරීම	1,000
සමාජ ආරක්ෂාව - නව දායකත්ව විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය	දැනට විශ්‍රාම වැටුප් නොලබන ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා **දායකත්ව විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය**	අයවැය යෝජනා තුළ ප්‍රතිපාදන වෙන් කිරීමක් නැත.
- ආපදා හේතුවෙන් ඇතිවන පීඩාකාරී බවින් මිදීම සඳහා දිලිඳු ජනතාවට සහාය වීමට ක්‍රියාකාරී වැඩසටහනක් (රැකියා වියුක්තිය, ආදායම් අහිමිවීම) - පුද්ගල කේන්ද්‍රීය ආර්ථිකයක් යටතේ	ලෝක වසංගතයෙන් බලපෑමට ලක් වූ ක්ෂුද්‍ර. කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන් සඳහා සහන සැපයීම	5,000
	ලෝක වසංගතය/ ලොක් ඩවුන් කාලසීමාව තුළ ආදායම් අහිමි වූ පාසල් වෑන් රථ රියදුරන් සඳහා සහන සැලසීම	400
	ලෝක වසංගතය/ ලොක් ඩවුන් කාලසීමාව තුළ ආදායම් අහිමි වූ ත්‍රීරෝද රථ රියදුරන් සඳහා සහන සැලසීම	600
	ලෝක වසංගතය කාලසීමාව තුළ ආදායම් අහිමි වූ පෞද්ගලික බස් හිමියන් සඳහා සහන සැලසීම	1,500
	ලෝක වසංගතයෙන් බලපෑමට ලක් වූ මංගල උත්සව සහ උත්සව කළමනාකරණ අංශය සඳහා සහන සැලසීම	500

මූලාශ්‍රය : අයවැය කතාව 2022

4.6.2 කාන්තාවන් සහ ළමුන් - කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය (මෙහි මින්පසු කාන්තා හා ළමා සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය වශයෙන් දැක්වේ.)

15 වගුව: කාන්තා හා ළමා සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම් - 2019 සිට 2022 දක්වා (ශ්‍රී. ලං. රු. මිලියන)

	2019	2020 (සංශෝධිත අයවැය)	2021 (ඇස්තමේන්තු)	2022 (AB අනුව)	වසරින් වසර වෙනස (2021 - 2022)	වර්ධන අනුපාතය
වියදම් සාරාංශය	360	36,352	30,450	23,805	6,645)	(-1.82%)
රාජ්‍ය අයවැයේ කොටසක් වශයෙන්		0.77%	0.60%	0.46%	-0.14%	-
දළ දේශීය නිෂ්පාදිතයේ කොටසක් වශයෙන්	0.00%	0.23%	0.18%	0.13%	-0.06%	-

මූලාශ්‍රය : 2021 අයවැය ඇස්තමේන්තු සහ 2022 විසර්ජන පනත් කෙටුම්පත

8 රූපසටහන - කාන්තා හා ළමා සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය සඳහා අයවැය ප්‍රතිපාදන වෙන් කිරීම් – 2019-2022



මූලාශ්‍රය : 2021 අයවැය ඇස්තමේන්තු සහ 2022 විසර්ජන පනත් කෙටුම්පත

අයවැය යෝජනා සහ විශ්ලේෂණය

2022 වර්ෂයේ දී, කාන්තා හා ළමා සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය සඳහා අයවැය ඇස්තමේන්තුව රුපියල් මිලියන 23,805 ක් වන අතර, එය 2021 වර්ෂයේ එම අමාත්‍යාංශය සඳහා අයවැය ඇස්තමේන්තුව වූ රුපියල් මිලියන 30,450 ට සාපේක්ෂව 21.6% ක අඩුවීමකි. පුනරාවර්තන සහ ප්‍රාග්ධන වියදම් යන දෙක ම 2021 වර්ෂයේ ඒවාට අදාළ මට්ටම් වලට වඩා අඩුවීමක් පෙන්නුම් කරයි. 2022 වර්ෂයේ අයවැය ඇස්තමේන්තු කෙටුම්පතට අනුව, සුබසාධන වැඩසටහන් කිහිපයක් සඳහා ප්‍රතිපාදන අඩුවෙන් වෙන් කිරීම මෙම ප්‍රතිපාදනවල අඩුවීමට හේතු විය හැක. පෙර පාසල් ළමුන් සඳහා උදෑසන ආහාරය ලබා දීම, පාසල් ළමුන් සඳහා කිරි වීදුරුවක් ලබා දීම, පාසල් නිල ඇඳුම් ලබා දීම සහ පාසලේ දී පෝෂ්‍යදායී ආහාර වේලක් ලබා දීමේ වැඩසටහන මෙම වැඩසටහන් අතර වේ.

ගැබිණි මව්වරුන් සඳහා රුපියල් 10,000 ක් බැගින් වූ පෝෂණ මල්ලක් ලබාදීමේ වැඩසටහනෙහි දැනට පවතින මාස 10 ක කාලය මාස 24 ක් දක්වා දීර්ඝ කිරීම අයවැය යෝජනා අතර ප්‍රධාන වේ. මෙම වැඩසටහන සඳහා දැනට පවතින ප්‍රතිපාදනවලට අමතරව තවත් රුපියල් මිලියන 1,000 ක් වෙන් කිරීමට 2022 අය-වැය මගින් යෝජනා කර ඇත.

2022 අයවැය මගින් ළමයින් හා ඔවුන්ගේ මානසික සෞඛ්‍ය සංවර්ධනය සම්බන්ධ ගැටළු කෙරෙහි අවධානය යොමු කිරීම සඳහා වැඩසටහනක් හඳුන්වා දීමට යෝජනාවක් ඉදිරිපත් කරනු ලැබුව ද ඒ සඳහා ප්‍රතිපාදන වෙන් කර නැත.

4.7 තාක්ෂණය මත පදනම් වන සමාජයක් – (VPS -7)

'තාක්ෂණය මත පදනම් වන සමාජයක්' යන්න සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශනයෙහි දක්වා ඇති ප්‍රතිපත්ති ප්‍රමුඛතා 10 න් එකකි. ශ්‍රී ලංකාව ගෝලීය නව නිපැයුම් කේන්ද්‍රස්ථානයක් බවට පත් වීමට, ජනතා කේන්ද්‍රීය ඩිජිටල් රාජ්‍ය තන්ත්‍රයක් බිහි කිරීමට, තොරතුරු තාක්ෂණ ව්‍යවසායකත්වයක් ප්‍රවර්ධනය කිරීමට සහ ඩිජිටල් වශයෙන් අන්තර්කරණය වූ ශ්‍රී ලංකාවක් උදෙසා කටයුතු කිරීමට ඉලක්ක කළ යුතු බව එහි සඳහන් වේ.

2022 අයවැය සමග ඉදිරිපත් කර ඇති ඇමුණුම්වල අදාළ ප්‍රතිපාදන ප්‍රමාණයන් දක්වමින් වියදම් යෝජනා ලැයිස්තුගත කර ඇත. සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශනයෙහි තාක්ෂණය මත පදනම් වන සමාජයක් යන ප්‍රතිපත්ති ප්‍රමුඛතාවය සෘජුව ම ආමන්ත්‍රණය කරන තාක්ෂණ අංශයට අදාළ එක ම ප්‍රතිපාදනය වන්නේ රුපියල් මිලියන 500 ක මුදලක් වෙන් කර ඇති 'රාජ්‍ය අංශය ඩිජිටල්කරණය කිරීම' නැමති යෝජනාවයි. විශේෂයෙන් ම, මෙම වියදම් යෝජනාව 'ජනතා කේන්ද්‍රීය ඩිජිටල් රාජ්‍යය' යන උප-ප්‍රමුඛතාවයට අදාළ වන අතර, එමගින් බොහෝ සේවාවන් අන්තර්ජාලය ඔස්සේ ලබා ගැනීමට හැකියාව තිබෙන තත්වයක් තුළ, වර්තමානයේ දී මෙන් අකාර්යක්ෂමතාවය, ප්‍රමාදයන් සහ සේවා ලබා ගැනීම සඳහා සේවා සපයන බොහෝ ස්ථාන වෙත ගමන් කිරීමට සිදුවීම හේතුවෙන් ජනතාව අපහසුතාවයට පත් නොකරන ආකාරයේ ක්‍රියාවලියක් අපේක්ෂා කරයි. තවද, ආයතනික මට්ටමෙන් සැලකූ විට, තාක්ෂණික සංවර්ධන විධිනියෝගය ආවරණය කරන අමාත්‍යාංශය සහ රාජ්‍ය අමාත්‍යාංශය යන දෙකටම 2022 විසර්ජන පනත් කෙටුම්පතෙහි ප්‍රතිපාදන වෙන් කර ඇත (වගුව 16).

16 වගුව: 2022 අයවැයෙහි තාක්ෂණික අංශය සඳහා වෙන් කිරීම්

අමාත්‍යාංශය	පුනරාවර්තන රුපියල් මිලියන	ප්‍රාග්ධන රුපියල් මිලියන	මුළු ප්‍රතිපාදනය රුපියල් මිලියන	මුළු ප්‍රතිපාදනය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස (%)
තාක්ෂණ අමාත්‍යාංශය	2,107	2,260	4,367	0.02%
ඩිජිටල් තාක්ෂණ සහ ව්‍යවසාය සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය	397	848	1,245	0.01%
එකතුව	2,504	3,108	5,612	0.03%

මූලාශ්‍රය: විසර්ජන පනත් කෙටුම්පත 2022, මුදල් අමාත්‍යාංශය විසින් සපයන ලද දත්ත

තාක්ෂණය තවමත් නැගී එමින් පවතින අංශයක් වන අතර, 2022 වර්ෂයේ අයවැයෙන් ඒ සඳහා සාපේක්ෂ වශයෙන් අඩු ප්‍රතිපාදනයක් වෙන් කර තිබේ. සෞභාග්‍යයේ දැක්ම-7 (තාක්ෂණය මත පදනම් වන සමාජයක්) සඳහා ලැබෙන්නේ දළ දේශීය නිෂ්පාදිතයෙන් 0.03% ක් පමණි. අදාළ අමාත්‍යාංශ අලුතින් පිහිටුවන ලද්දේ 2021 වර්ෂයේ දී බැවින්, පසුගිය 2021 අයවැය තුළ තාක්ෂණය පිළිබඳ සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රමුඛතාවයට අදාළ යෝජනා කිසිවක් නොතිබූ බව අවධානයට

ගත යුතුය. එහෙයින්, සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශනයෙහි නිශ්චිතව දක්වා ඇති සියලු ම අදාළ විධිවිධාන සපුරාලීම සඳහා අනාගතයේ දී මෙම අංශයට තව දුරටත් වර්ධනය වීමේ සහ විශාල වශයෙන් අයවැය ප්‍රතිපාදන ලැබීමේ විභවය තිබේ.

රාජ්‍ය අංශය ඩිජිටල්කරණය කිරීම සඳහා 2022 වර්ෂයේ අයවැයෙන් වෙන් කර ඇති තාක්ෂණය ආශ්‍රිත එක් වියදම් ප්‍රතිපාදනය හැරුණු විට, 2022 අයවැය කතාවේ ඩිජිටල්කරණය සහ තාක්ෂණය පදනම් කරගත් මූලපිරීම් පිළිබඳ අමතර සඳහන් කිරීම් කිහිපයක් ඇති අතර, ඒ සඳහා නිශ්චිත වියදම් ප්‍රතිපාදන වෙන් කර නොමැත. ඒවා පහත සඳහන් පරිදි වේ:

- සාම්ප්‍රදායික බැංකු නව තාක්ෂණයන්හි වෙනස් වීම් සිදු වන වේගයට ගැලපෙන තාක්ෂණයන් යොදා ගනිමින් අදාළ පරිදි පරිවර්තනය විය යුතුය. ඩිජිටල්කරණය භාවිතා කරමින් තමන්ගේ ශාඛා ස්මාර්ට් බැංකු ඒකක බවට පත් කිරීමට බැංකු දිරිමත් කිරීමත් කළ යුතු යැයි යෝජනා කරනු ලැබේ. ප්‍රාග්ධන අවශ්‍යතා සහ බලපත්‍ර ලබාදීම ආදිය පිළිබඳව ද ඇතුළුව අවශ්‍ය නීති සහ නියාමන රාමු හඳුන්වා දෙන ලෙස මහ බැංකුවෙන් ඉල්ලා සිටිනු ලැබේ.

- අවශ්‍ය මූල්‍ය හා තාක්ෂණික සහාය විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවට ලබා දීමට යෝජනා කර ඇති, ෆයිබර් ඔප්ටික් තාක්ෂණය භාවිතා කරමින් දිවයිනේ පාසල් 10,155 ම ආවරණය වන පරිදි රටපුරා විදුලි සංදේශ ජාලයක් කඩිනමින් ස්ථාපනය කිරීමේ යෝජනාව.

පළමු යෝජනාව සඳහා මහ බැංකුව විසින් ස්මාර්ට් බැංකු ආරම්භ කිරීමට අවශ්‍ය නීතිමය රාමුව සකස් කළ යුතු නමුත් ඒ සඳහා නිශ්චිත වියදම් ප්‍රතිපාදනයක් සිදු කර නැත. විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව වෙත අවශ්‍ය මූල්‍ය සහාය ලබා දෙන බව දෙවන යෝජනාවේ සඳහන් වන නමුත් නිශ්චිත ප්‍රතිපාදන කිසිවක් එහි සඳහන් කර නැත.

4.8 භෞතික සම්පත් සහ ප්‍රවාහන හා සන්නිවේදනය සංවර්ධනය කිරීම - (VPS 8)

සෞභාග්‍යයේ දැක්ම (VPS) 8 - භෞතික සම්පත් සංවර්ධනය - යටතේ වන මධ්‍යම රජයේ ක්‍රියාකාරකම් මගින් (i) 'C' හැඩැති ආර්ථික කොරිඩෝ නවයක්; (ii) නගර නැවත සැලසුම් කිරීම; (iii) නගර සංවර්ධනය; (iv) සුවපහසු ගමන් - සොබාදහම් හිතකාමී ප්‍රවාහන ජාලය; (v) වරාය සහ ගුවන් සේවා; (vi) පුනර්ජනනීය බලශක්තිය වෙත පරිවර්තනය; (vii) ජල සම්පත් කළමනාකරණය; සහ (viii) ආපදා කළමනාකරණය සංවර්ධනය කිරීම සඳහා වන සැලසුම් ඔස්සේ ක්‍රියාකාරකම් සමූහයක් කෙරෙහි අවධානය යොමු කර ඇත. එම අදාළ ක්‍රියාකාරකම් පහත සඳහන් අමාත්‍යාංශ සහ රාජ්‍ය අමාත්‍යාංශ 15 විසින් ක්‍රියාත්මක කිරීමට හඳුනාගෙන ඇත: ප්‍රවාහන අමාත්‍යාංශය, මහාමාර්ග අමාත්‍යාංශය, ග්‍රාමීය මාර්ග සහ අනෙකුත් යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශය, සූර්යබල, සුළං සහ ජල විදුලි ජනන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය, ඉඩම් අමාත්‍යාංශය, නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය, නාගරික සංවර්ධන, අපද්‍රව්‍ය බැහැරලීම සහ ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය, ග්‍රාමීය නිවාස, ඉදිකිරීම් සහ ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශය, වතු නිවාස හා ප්‍රජා යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශය, වෙරළ සංරක්ෂණ සහ පහත්බිම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය, ජල සම්පාදන අමාත්‍යාංශය, ග්‍රාමීය හා ප්‍රාදේශීය පානීය ජල සම්පාදන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය, වාරිමාර්ග අමාත්‍යාංශය, මහවැලි කලාප ආශ්‍රිත ඇලවේලි ජනාවාස පොදු යටිතල පහසුකම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය, ග්‍රාමීය කුඹුරු හා ආශ්‍රිත වැව්, ජලාශ හා වාරිමාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය.

17 වගුව: වෙන් කර ඇති අයවැය ප්‍රතිපාදනවල ප්‍රතිශතයක් ලෙස අමාත්‍යාංශවල මුළු වියදම්

අමාත්‍යාංශය/ රාජ්‍ය අමාත්‍යාංශය	ප්‍රතිපාදනය	මුළු ප්‍රතිපාදනවලින් %
ප්‍රවාහන අමාත්‍යාංශය	33,230	0.61
මහාමාර්ග අමාත්‍යාංශය	270,191	4.99
ග්‍රාමීය මාර්ග සහ අනෙකුත් යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශය	10,076	0.19
සූර්ය බල, සුළං සහ ජල විදුලි ජනන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය	533	0.01
ඉඩම් අමාත්‍යාංශය	8,867	0.16
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය	16,305	0.30
නාගරික සංවර්ධන, අපද්‍රව්‍ය බැහැර කිරීම සහ ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය	4,419	0.08
ග්‍රාමීය නිවාස ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය	13,001	0.24
වතු නිවාස හා ප්‍රජා යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශය	2,971	0.05
වෙරළ සංරක්ෂණ සහ පහත් බිම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය	2,782	0.05
ජල සම්පාදන අමාත්‍යාශය	47,514	0.88
ග්‍රාමීය හා ප්‍රාදේශීය පානීය ජල සම්පාදන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය	2,140	0.04
වාරිමාර්ග අමාත්‍යාංශය	67,847	1.25
මහවැලි කලාප ආශ්‍රිත ඇලවේලි ජනාවාස පොදු යටිතල පහසුකම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය	5,960	0.11
ග්‍රාමීය කුඹුරු හා ආශ්‍රිත වැව්, ජලාශ හා වාරිමාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය	3,077	0.06
නෝරාගත් අමාත්‍යාංශවල එකතුව	488,913	9.02

මූලාශ්‍රය: විසර්ජන පනත් කෙටුම්පත 2022, මුදල් අමාත්‍යාංශය විසින් සපයන ලද දත්ත

භෞතික සම්පත් සංවර්ධනය කිරීම නැමති තේමාව යටතේ ඉහත හඳුනාගෙන ඇති ප්‍රතිපත්ති ප්‍රමුඛතාවයන් වෙනුවෙන් 2022 වර්ෂය සඳහා වෙන් කර ඇති අයවැය ප්‍රතිපාදන මෙම කොටස මගින් විමසා බලනු ලැබේ. රුපියල් 5,419,570,000 ක් වූ මුළු අයවැයෙන් අදාළ අමාත්‍යාංශවලට රුපියල් 488,911,422,000 ක් වෙන්කර ඇත. කෙසේ වෙතත්, මෙම ප්‍රතිපාදනයට වැඩසටහන් නොවන ක්‍රියාකාරකම් ද, සෞභාග්‍යයේ දැක්ම 8 වන ප්‍රතිපත්තියට බාහිර වැඩසටහන් ද ඇතුළත් වන බවත්, සෞභාග්‍යයේ දැක්ම 8 වන ප්‍රතිපත්තිය යටතේ වන සමහර වැඩසටහන් වෙනත් අමාත්‍යාංශ යටතේ ද සලකා බලනු ලබන බවත් සඳහන් කිරීම වැදගත් වේ.

18 වගුව: සෞභාග්‍යයේ දැක්ම 8 වන ප්‍රතිපත්තිය යටතේ හඳුනාගෙන ඇති ශ්‍රී ලංකා රජයේ ප්‍රතිපත්ති ප්‍රමුඛතා සඳහා අයවැය ප්‍රතිපාදන

සෞභාග්‍යයේ දැක්ම 8 වන ප්‍රතිපත්තිය යටතේ රජයේ ප්‍රතිපත්ති ප්‍රමුඛතාවය - භෞතික සම්පත් සංවර්ධනය කිරීම	**සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්තියෙහි ප්‍රධාන අපේක්ෂාවන්**	**අයවැය සාරාංශයට අනුව වැඩසටහන් සඳහා වෙන් කිරීම්**
සුවපහසු ගමන් - සොබාදහම් හිතකාමී ප්‍රවාහන ජාලයක් 'C' හැඩැති ආර්ථික කොරිඩෝ නවයක්	ප්‍රවාහන සේවා, මාර්ග ජාලය සහ සම්බන්ධතාවය වැඩිදියුණු කිරීම	සේවා නවීකරණය කිරීම සහ වැඩිදියුණු කිරීම සඳහා ජාතික ගමනාගමන කොමිෂන් සභාව, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය සහ ශ්‍රී ලංකා දුම්රිය සේවාව වෙත රුපියල් මිලියන 2,000 ක ප්‍රතිපාදනයක්. කොළඹ වරාය පිවිසුම් මාර්ගය යටතේ වන ඒකාබද්ධ ව්‍යාපෘති වෙනුවෙන් 2022 වසර සඳහා රුපියල් මිලියන 260,000 ක් වෙන් කර ඇත. එමෙන් ම, මාර්ග කිලෝමීටර් 100,000 ක් සඳහා රුපියල් මිලියන 20,000 ක් වෙන් කරනු ඇත. මගී ප්‍රවාහනය සඳහා රුපියල් මිලියන 2,000 ක් ද, නාගරික සංවර්ධන වැඩසටහන් සඳහා රුපියල් මිලියන 7,000 ක් ද වෙන් කර ඇත.
පුනර්ජනනීය බලශක්තිය කරා පරිවර්තනය වීම	අඩු වියදම් බලශක්තිය සඳහා රටට ප්‍රවේශය තිබෙන බව සහතික කිරීම.	පුනර්ජනනීය බලශක්ති අංශයේ පෞද්ගලික ආයෝජන දිරිමත් කිරීම සඳහා පහසුකම් සැලසීම පිණිස රුපියල් මිලියන 500 ක් වෙන් කර ඇත.
ජල සම්පත් කළමනාකරණය	රටේ ජනතාවගෙන් 100% ක් සඳහා ම පිරිසිදු, සුරක්ෂිත පානීය ජලය සහ නළ ජලය සපයා දෙනු ලබන බව සහතික කිරීම.	සුළු වාරිමාර්ග යෝජනා ක්‍රම යටතේ කුඩා වැව්, අමුණු, ඇල, වේලි ප්‍රතිසංස්කරණය කිරීම සහ පෝෂක ප්‍රදේශ සංවර්ධනය කිරීම ඇතුළු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා රුපියල් මිලියන 2,000 ක ප්‍රතිපාදන වෙන් කර ඇත.
නගර නැවත නිර්මාණය කිරීම නගර සංවර්ධනය කිරීම 'C' හැඩැති ආර්ථික කොරිඩෝ නවයක්	එකම පළාතේ දිස්ත්‍රික්ක අතර සහ නගර අතර පවතින අසමාන නාගරීකරණය සහ ප්‍රාදේශීය විෂමතාවයන් ආමන්ත්‍රණය කිරීම	නාගරික නිවාස සංවර්ධනයට රුපියල් මිලියන 2,000 ක්. ග්‍රාමීය නිවාස සංවර්ධනයට රුපියල් මිලියන 5,000 ක්. වතු නිවාස සංවර්ධනයට රුපියල් මිලියන 500ක්. වත්තල, ජාඇල කටාන, ගම්පහ සහ කැලණිය යන ප්‍රදේශවල ගංවතුර අවදානම සහිත පහත් බිම්වල වැව් සහ ඇළ මාර්ග සංවර්ධනය සඳහා රුපියල් මිලියන 7,000 ක් වෙන් කර ඇති අතර හැමිල්ටන් ඇළ ආශ්‍රිත ප්‍රදේශ ද පරිසර හිතකාමී ලෙස සංවර්ධනය කරනු ලැබේ. එමෙන් ම, දේශීය හා විදේශීය ආයෝජන ද අපේක්ෂා කරනු ලැබේ.

මූලාශ්‍රය: ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ සම්පාදනය

නව සාමාන්‍යකරණය යටතේ ආර්ථිකය පුනර්ජීවනය උදෙසා රාජ්‍ය ආයෝජන සිදු කිරීම සඳහා අවධානය යොමු වී ඇති අතර යටිතල පහසුකම් සංවර්ධනය එහිලා වැදගත් ක්ෂේත්‍රයක් වේ. එය රැකියා උත්පාදනයට ද ප්‍රයෝජනවත් හැකි අතර ආර්ථිකය නගා සිටුවීමට ද උපකාර විය හැකිය.

'ජල මූලාශ්‍ර කළමනාකරණය' මැයෙන් වන ප්‍රතිපත්ති ප්‍රමුඛතාව යටතේ නල ජලය සැපයීම ප්‍රකාරව අයවැය කථාවෙහි දැක්වෙන්නේ "ජනගහනයෙන් සියයට 56 කට පමණක් පිරිසිදු පානීය ජලය ලැබෙන බවයි." ඒ අනුව දළ වශයෙන් නිවාස ඒකක 200,000 කට නල ජලය සැපයීමට හා ප්‍රජා ජල ව්‍යාපෘති පුළුල් කිරීමටත් ජලාශවල ධාරිතාව ඉහළ නැංවීමටත් ජල මූලාශ්‍ර සංරක්ෂණය කිරීමටත් 2022 අය වැයෙන් අවධානය යොමු කර ඇත. ඊට සමගාමීව රට පුරා නව ජල සැපයුම් 3,314,500 ක් ලබා දෙන බව අයවැය කථාවේ සඳහන් වී ඇත. ඒ අනුව ජල සැපයුම් සම්බන්ධතා සංඛ්‍යාවෙහි යම් අපැහැදිලිතාවක් දක්නට ලැබේ.

'පුනර්ජනනීය බලශක්තිය භාවිතය වෙත පරිවර්තනය' මැයෙන් වන ප්‍රතිපත්ති ප්‍රමුඛතාව යටතේ සමුච්චිත බලශක්ති ඉල්ලුමෙන් 70% ක් පුනර්ජනනීය බලශක්තිය මඟින් වසර 2030 වන විට සපුරාලීම ඉලක්කගත කර තිබේ. මෙම අපැහැදිලි ඉලක්කය සාක්ෂාත් කර ගැනීම සඳහා පුනර්ජනනීය බලශක්ති ක්ෂේත්‍රයෙහි පුද්ගලික ආයෝජන දිරිමත් කිරීමට රුපියල් මිලියන 500 ක් පමණක් වෙන් කිරීම ප්‍රමාණවත් නොවේ. පුනර්ජනනීය බලශක්ති උත්පාදනය සඳහා ඉහළ ආයෝජන පිරිවැයක් දැරීමට සිදු වන බැවින් ඒ හා සබැඳි ක්ෂේත්‍රවලට ඉහළ අනුපූරක ප්‍රතිපාදන වෙන් කිරීමේ අවශ්‍යතාවක් පැවතීම ඊට හේතුවයි.

නිවාස පහසුකම්, 'නාගරික පහසුකම් නව්‍යකරණය සහ නගර සංවර්ධනය' මැයෙන් වන ප්‍රතිපත්ති ප්‍රමුඛතාව හා සබැඳි කරුණකි. සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශනයෙන් මෙම ක්ෂේත්‍රය සෑමඅංශයකින්ම ආවරණය කර ඇත්තේ නාගරික, ග්‍රාමීය හා වතු නිවාස මෙන්ම ගංවතුර තර්ජන පවතින ප්‍රදේශ පිළිබඳ අවධානය යොමු කරමිනි. එහෙත් වතුකරයේ නිවාසවල තත්ත්වය ඛේදජනක බවත් වතුකරයේ ජනතාවගේ ජීවන තත්ත්වය නංවාලීම වගකීමක් ලෙසට අයවැය කථාව මඟින් පිළිගැනුණ ද ඒ සඳහා යෝජිත වෙන් කිරීම් නොමඟ යවන සුළුය. වතුකරයේ නිවාස පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා ඉදිරි වසර තුන තුළදී රුපියල් මිලියන 500 ක් නිශ්චිතව වෙන් කර තිබේ. එසේ වුවද, අදාල ප්‍රතිපාදනවලින් 2022 වසර සඳහා වෙන් කර ඇති මුදල අපැහැදිලිය.

භෞතික සම්පත් වැඩිදියුණු කිරීම සඳහා වන පිරිවැය සම්බන්ධයෙන් වන වෙන් කිරීම් සෞභාග්‍යයේ දැක්මට අනුකූල රජයේ වැඩපිලිවෙල යටතේ මැනවින් සඳහන් කර තිබේ. 2021 වසරට සාපේක්ෂව 2022 වසර වෙනුවෙන් ඒ හා සබැඳි අමාත්‍යාංශ 15 සඳහා සිදු කර ඇති වෙන් කිරීම් පහත වැටී ඇත. 2022 වසර සඳහා වන වෙන් කිරීම්වල සමස්ත වියදම්වලින් 93% ක් ප්‍රාග්ධන වියදම් සඳහා වෙන් කර ඇත. සියලු අමාත්‍යාංශ සඳහා වෙන් කෙරුණු අයවැය ප්‍රතිපාදන අතරින් සෞභාග්‍යයේ දැක්ම වැඩපිලිවෙල යටතේ අවධානයට ලක් වූ අමාත්‍යාංශ 15 සඳහා සිව්වැනියට වැඩිම අගය වන 9% ක ප්‍රතිපාදන වෙන් කර තිබේ. 2022 වසරේදී මෙම ප්‍රතිපත්ති ප්‍රමුඛතා සාක්ෂාත් කර ගැනීම සඳහා සැලකිය යුතු ප්‍රතිපාදන ප්‍රමාණයක් වෙන් කර ඇති බව මෙමඟින් පෙනී යයි.

4.9 තිරසාර පාරිසරික කළමනාකරණය - (VPS -9)

පාරිසරික ක්ෂේත්‍රයට පරිසර අමාත්‍යාංශය, වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශය සහ වනජීවී රැකවරණය රාජ්‍ය අමාත්‍යාංශය ඇතුලත් වෙයි. 2022 වසර සඳහා සැලසුම් කළ පිරිවැය රුපියල් මිලියන 13,351/- ක් වන අතර එය 2021 වසර සඳහා සසඳා බලන කල 45% ක නාමික වර්ධනයකි. වැඩි කළ ප්‍රතිපාදන පරිසර අමාත්‍යාංශය සහ වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශය වෙත මූලික වශයෙන් වෙන් කර තිබේ. සමස්ත අයවැය ඇස්තමේන්තුවට අනුව එම වෙන් කිරීම් 0.25% ක් වන අතර එය 2021 වසරේ 0.19% ක අගය හා සසඳා බලන කල සුළු වර්ධනයකි. 2022 වසර සඳහා වන එම වෙන් කිරීම් දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස ආසන්න වශයෙන් 0.07% කි.

19 වගුව: පාරිසරික පිරිවැය පිළිබඳ සාරාංශය (රුපියල් මිලියන)

අමාත්‍යාංශය	රජයේ පිරිවැය / වෙන් කිරීම්		වසරින් වසරට වෙනස[අ]
	2021 වසරේදී සංශෝධිත (ඡන්දය ප්‍රකාශිත)	**2022 අයවැය (යෝජනා ද ඇතුලත්ව)**	**2021-2022**
පරිසර අමාත්‍යාංශය	1,997	3,598	1,601 (80%)
වනජීවී හා වනසංරක්ෂණ අමාත්‍යාංශය	1,236	3,282	2,046 (166%)
වනජීවී රැකවරණ රාජ්‍ය අමාත්‍යාංශය	6,115	6651	536 (9%)
පරිසර ක්ෂේත්‍රයේ සමස්ත අගය	**9,348**	**13,531**	**4,183 (45%)**
රජයේ අයවැයේ කොටසක් ලෙස	0.19%	0.25%	0.06%
දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස	0.06%	0.07%	0.02%

සටහන් : අ: ප්‍රතිශත වෙනස වරහන් තුළ දක්වා ඇත.

මූලාශ්‍රය: 2021 අයවැය ඇස්තමේන්තු කෙටුම්පත සහ අයවැය කථාව, යෝජනා ද ඇතුලත් 2022 විසර්ජන පනත් කෙටුම්පත

සෞභාග්‍යයේ දැක්මට අදාල රජයේ ප්‍රතිපත්ති රාමුවට අනුකූලව තිරසාර සංවර්ධනයේ වැදගත් අංශයක් ලෙස තිරසාර පාරිසරික ප්‍රතිපත්තියක් තිබීම හඳුනාගෙන තිබේ. ඒ අනුව ඉඩම්, කර්මාන්ත, අපද්‍රව්‍ය කළමනාකරණය, ජෛව විවිධත්වය, ජනාවාස හා නගර, වායුගෝලය, සාගර සම්පත් සහ පාරිසරික අධ්‍යාපනය ප්‍රතිපත්තිමය වශයෙන් වැදගත් මෙම ක්ෂේත්‍රයට ඇතුලත් වෙයි. හරිත ආර්ථිකයක් ගොඩ නැගීමේ සංකල්පය ඉදිරියට ගෙන යාමක් ලෙස 2022 වසර සඳහා වන යෝජනා අයවැය කථාවෙන් හඳුන්වයි. ඊට අමතරව මතු කියැවෙන ක්‍රියාකාරකම් ද 2022 වසර සඳහා වන අයවැයෙන් හඳුනාගෙන තිබේ.

20 වගුව: පාරිසරික ක්ෂේත්‍රය සඳහා අයවැයෙන් වෙන් කිරීම්, ප්‍රතිපත්ති ප්‍රමුඛතාව සහ වැඩසටහන අනුව

යෝජනාව	වෙන් කිරීම (රුපියල් මිලියන)
පරිසර සංරක්ෂණය	වෙන් කිරීම රුපියල් මිලියන - 2,000 ▪ ජලය ව්‍යසන අපද්‍ර ,කළමනාකරණය ,ශබ්ද කළමනාකරණය ,පස සංරක්ෂණය ඇතුළු නාගරික වනාන්තර ස්ථාපනය සහ අලංකරණය ▪ පරිසර හිතකාමී අන්දමින් දිවයිනේ ගංගා 103 ක් හා ගංගා නිම්න සංරක්ෂණය ▪ මුතුරාජවෙල පරිසර සංවේදී කලාපය රම්සා තෙත් බිමක් ලෙස සංරක්ෂණය
වන සංරක්ෂණය	වෙන් කිරීම රුපියල් මිලියන - 2,000 ▪ වන ආවරණය 30% කින් වැඩි කිරීම . ▪ ජලාධාර ප්‍රදේශ .ආරක්ෂා කිරීම ▪ ආක්‍රමණික ශාක ඉවත් කිරීම සහ ප්‍රතිලාභී ශාක මඟින් වන ආවරණය ඉහළ නැංවීම
වනජීවීන් ආරක්ෂා කිරීම	වෙන් කිරීම රුපියල් මිලියන - 1,000 ▪ කුඩා වැව් සහ සතුන් ගැවසෙන පරිසරය සංවර්ධනය කෙරේකෘෂිකර්මාන්තයට . රක්ෂා කිරීම අපගේ හානි කරන සතුන් පාලනය කරන අතරතුර වනජීවීන් ආ යුතුකම හා වගකීම වේ

මූලාශ්‍රය : අයවැය කථාවේ විශේෂතා 2022

ඇස්තමේන්තුගත වියදම 21 වගුව විස්තර කර ඇති ආකාරයට බෙදා හැර ඇත. ප්‍රතිපාදනවලින් 61% ක් ප්‍රාග්ධන වියදම් වෙනුවෙන් ද ඉතිරිය (39%) පුනරාවර්තන වියදම් සඳහා ද වෙන් කර තිබේ. මහජන වියදම් උදෙසා අයවැය ප්‍රතිපාදනවලින් වෙන් වී ඇති මුදල ආසන්න වශයෙන් 25% කි. රටේ සමස්ත ප්‍රාග්ධන අයවැය වෙන් කිරීම්වලින් 0.33% ක් රජය තිරසාර පාරිසරික කළමනාකරණය වෙනුවෙන් වැය කරයි. මහජන වියදම්වලින් ඊට වෙන් කර ඇති කොටස රටේ සමස්ත ඇස්තමේන්තුවලින් 0.51% ක් වන අතර එමඟින් සංසන්දනාත්මකව අඩු දායකත්වයක් පෙන්නුම් කරයි.

21 වගුව: යෝජනා ද ඇතුලත්ව පාරිසරික වියදම් ඇස්තමේන්තුව

අමාත්‍යාංශය/ රාජ්‍ය අමාත්‍යාංශය	ප්‍ර.අ.	වෙනත්	පුනරාවර්තන	ප්‍රාග්ධන	එකතුව
පරිසර අමාත්‍යාංශය	259	864	1,123	2,475	3,598
වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශය	78	129	207	3,075	3,282
වනජීවී රැකවරණ රාජ්‍ය අමාත්‍යාංශය	3,003	947	3,951	2,700	6,651
පරිසරය සඳහා එකතුව	3,341	1,940.5	5,281.5	8,250	13,531
සමස්ත පාරිසරික පිරිවැයේ ප්‍රතිශතයක් ලෙස	25%	14%	39%	61%	100%
සමස්ත අයවැයෙන්	652,444	2,290,182	2,942,626	2,476,944	5,419,570
සමස්ත අයවැයේ ප්‍රතිශතයක් ලෙස	0.51%	0.08%	0.18%	0.33%	0.25%

මූලාශ්‍රය : 2022 මූල්‍ය වසර සඳහා විසර්ජන පනත් කෙටුම්පත (2022 අයවැය යෝජනා ද මෙම අගයන්ට ඇතුලත් වේ)

පෙර වසර හා සැසඳීමේදී 2022 අයවැය තිරසාර පාරිසරික කළමනාකරණය සඳහා වන ප්‍රතිපාදන නාමිකව 45% කින් ඉහළ නංවා තිබුණ ද සැලසුම් කර ඇති ක්‍රියාකාරකම් තීව්‍ර කිරීම සඳහා ධාරිතාව ඉහළ නැංවීමට එම අගය ප්‍රමාණවත් නොවන්නේ අයවැය ප්‍රතිපාදනවලින් 1% කටත් වඩා අඩු අගයක් හිමි වන ක්ෂේත්‍ර හතර අතරට එය ද ඇතුලත් වීම හේතුවෙනි. එලදායී ප්‍රාග්ධන ප්‍රතිපාදන අපේක්ෂා කළ හැකි පරිදි ප්‍රාග්ධන ආයෝජන ධනාත්මක ප්‍රවණතාවක් පෙන්නුම් කර ඇත.

දළ දේශීය නිෂ්පාදිතයේ කොටසක් ලෙස 2021 වසරේදී වෙන් කිරීම් 0.06% ක් වන අතර 2022 වසර සඳහා ඇස්තමේන්තුව 0.07% ක් වේ. අනෙකුත් රටවල ප්‍රතිපාදන සාපේක්ෂ වශයෙන් පහළ අගයක් ගනී. යුරෝස්ටැට් දත්තවලට අනුව 2019 වසරේදී පරිසර ආරක්ෂණය වෙනුවෙන් යුරෝපීය සංගමයේ රටවල රජයන් මඟින් වෙන් කෙරුණු ප්‍රතිපාදන එම එක් එක් රටවල දළ දේශීය නිෂ්පාදිතයෙන් 0.2% සිට 1.4% දක්වා වූ වෙනස් අගයක් ගත් අතර 2019 වසරේදී ඉන්දියාවේ එම අගය දළ දේශීය නිෂ්පාදිතයෙන් 0.1% ක් විය. රටවල සංවර්ධනය සමඟ ප්‍රතිපාදන ද ප්‍රමාණාත්මකව ඉහළ යනු ඇත.

හඳුනාගත් ක්‍රියාකාරකම් රජයේ ප්‍රතිපත්ති රාමුව හා අනුකූල වන අතර ඒවා පරිසර සංරක්ෂණය හා කළමනාකරණය යන දෙඅංශයටම දායකත්වය සපයයි. කර්මාන්ත, ඝන නොවන අපද්‍රව්‍ය කළමනාකරණය, වායුගෝලය, සාගර සම්පත් සහ පාරිසරික අධ්‍යාපනය වෙනුවෙන් සිදු කෙරුණු අමතර ප්‍රතිපාදන ඇතැම් යෝජනාවල පැහැදිලිව දක්නට නොමැත. ඉඩම් වැනි ඇතැම් වැදගත් අංශවලට අදාලව (කාලීන වශයෙන්) තිරසාර කෘෂිකර්මාන්තය, සත්ත්ව පාලනය සහ වැව්ලි කෘෂිකර්මාන්තය යනාදී ක්ෂේත්‍ර වැඩිදියුණු කිරීම උදෙසා විද්‍යාත්මක ක්‍රමවේද භාවිතය යෝජනාවල සාකච්ඡා නොවේ. කෙසේ වෙතත් පුනරාවර්තන ක්‍රියාකාරකම් මඟින් මහ හැරී ඇති බොහෝ අංශ (සාගර සම්පත්, අධ්‍යාපනය හා දැනුවත් කිරීම) 2021 වසරේ සිට ආවරණය කර ඇත.

ස්තුතිය

කාරක සභාවේ කර්තව්‍යය ඉටුකිරීම සඳහා සහාය දැක්වූ සියළුම සාමාජික මන්ත්‍රීවරුන්ට හා නිලධාරීන්ට කාරක සභාව සිය කෘතඥතාවය පිරිනැමීමට අදහස් කරයි.

සාමාජික මන්ත්‍රීවරුන්

ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා (සභාපති)
ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා
ගරු සුසිල් ප්‍රේමජයන්ත මහතා
ගරු විදුර වික්‍රමනායක මහතා
ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා
ගරු (ආචාර්ය) නාලක ගොඩහේවා මහතා
ගරු විජිත හේරත් මහතා
ගරු ඩිලාන් පෙරේරා මහතා
ගරු කුමාර වෙල්ගම මහතා
ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
ගරු මනුෂ නානායක්කාර මහතා
ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා
ගරු (වෛද්‍ය) කාවින්ද හේෂාන් ජයවර්ධන මහතා
ගරු මුජීබුර් රහුමාන් මහතා
ගරු ඉසුරු දොඩන්ගොඩ මහතා
ගරු අනුප පැස්කුවල් මහතා
ගරු නලින් ප්‍රනාන්දු මහතා
ගරු (මහාචාර්ය) රංජිත් බණ්ඩාර මහතා

සහභාගී වූ නිලධාරීන්

එස්. ආර්. ආටිගල මහතා, භාණ්ඩාගාර ලේකම්, මුදල් අමාත්‍යාංශය
ජූඩ් නිලුක්ෂාන් මහතා, අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අයවැය දෙපාර්තමේන්තුව
අනෝමා නන්දනී මෙනෙවිය, අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අයවැය දෙපාර්තමේන්තුව
ආචාර්ය කපිල සේනානායක මහතා, අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
ඩී. කොටින්කඩුව මහත්මිය, අධ්‍යක්ෂ, රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
කේ.එම්. කුමාරසිරි මහතා, නියෝජ්‍ය අධ්‍යක්ෂ, රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
පී. කොඩිප්පිලි මහතා, සහකාර අධ්‍යක්ෂ, රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
ආචාර්ය දුෂ්නි වීරකෝන් මහත්මිය, විධායක අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය
ආචාර්ය නිශා අරුණතිලක මහත්මිය, පර්යේෂණ අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය
එස්.එම්.ඩී.එස්.එස්. රෝහිත මහතා , නියෝජ්‍ය විගණකාධිපති, ජාතික විගණන කාර්යාලය
ජී.එච්.ඩී. ධර්මපාල මහතා, නියෝජ්‍ය විගණකාධිපති, ජාතික විගණන කාර්යාලය
ඩී.ඒ.ඒ. වනිගසේකර මහතා, සහකාර විගණකාධිපති, ජාතික විගණන කාර්යාලය

ඇමුණුම 1

අ 1 වගුව: ශ්‍රී ලංකා රජයේ ප්‍රතිපත්ති ප්‍රමුඛතාවයන් අනුව වියදම් වෙන් කිරීම (2022 අයවැය කථාව - ඇමුණුම IV)

ජාතික ප්‍රතිපත්ති රාමුව	ප්‍රතිපත්ති ප්‍රමුඛතාවයන් අනුව වියදම් වෙන් කිරීම
1. ජාතික ආරක්ෂාව කෙරෙහි ප්‍රමුඛත්වය	36
2. මිත්‍රශීලී, නොබැඳි විදේශ ප්‍රතිපත්තිය	-
3. දූෂණයෙන් තොර පරිපාලනය	18, 19, 44-47
4. ජනතා පැතුම් ඉටු කරන නව ව්‍යවස්ථාව	-
5. ඵලවත් පුරවැසියෝ සහ ජවසම්පන්න මානව සම්පත	22- 25, 29-31, 33, 39, 43, 45, 49
6. ජනතා-කේන්ද්‍රික ආර්ථික සංවර්ධනය	1-9, 13, 20, 21, 40,41, 50
7. තාක්ෂණය-පාදක සමාජය	42
8 භෞතික සම්පත් සංවර්ධනය	10-12, 14-17, 32,34,35,37,38,48
9. තිරසාර පරිසර කළමනාකරණය	26, 27,28
10. විනය-ගරුක, නීති-ගරුක හා සාරධර්ම සපිරි සමාජය	-

සටහන : ඉලක්කම් වියදම් රේඛා දක්වයි (පහත අ 2 වගුව බලන්න).

අ 2 වගුව: වියදම් යෝජනා

අංකය		වෙන් කිරීම (ශ්‍රී ලංකා රුපියල් මිලියන)
1.	වස විසෙන් තොර වල්නාශක භාවිතය සඳහා සහන	4,000
2.	කෘෂිකාර්මික අංශය නවීකරණය	5,000
3.	වැවිලි ක්ෂේත්‍රය නවීකරණය සහ සහන සැලසීම	10,000
4.	ධීවර හා ජලජ ජීවී අංශය සංවර්ධනය	1,000
5.	පශු සම්පත් සංවර්ධනය	1,000
6.	පාරම්පරික ගෘහ කර්මාන්ත සංවර්ධනය	1,000
7.	අත්යන්ත්‍ර, බතික් ඇතුළු පේෂ කර්මාන්ත සංවර්ධනය	1,000
8.	නව නිෂ්පාදන ආයෝජන කලාප යටිතල පහසුකම්	5,000
9.	සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත කලාප	5,000
10.	සැමට ජලය වැඩසටහන	15,000
11.	වාරි සෞභාග්‍ය	20,000
12.	මාර්ග කි.මී. 100,000 (වතු මාර්ග ඇතුළු)	20,000
13.	පුනර්ජනනීය බලශක්ති සංවර්ධනය	500
14.	නාගරික නිවාස සංවර්ධනය	2,000
15.	ග්‍රාමීය නිවාස සංවර්ධනය	5,000
16.	වතු නිවාස සංවර්ධනය	500

17.	ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘති	42,063
18.	පළාත් පාලන කොට්ඨාස සංවර්ධනය	19,668
19.	විමධ්‍යගත අයවැය	3,375
20.	ග්‍රාමීය ජීවනෝපාය සංවර්ධනය	19,894
21.	ක්ෂුද්‍ර, සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර සහන	5,000
22.	පාසල් වෑන් රථ හිමියන් සඳහා සහන	400
23.	ත්‍රීරෝද රථ හිමියන් සඳහා සහන	600
24.	පෞද්ගලික බස් රථ හිමියන් සඳහා සහන	1,500
25.	කලා නිර්මාණ හා විනෝදාස්වාද ක්ෂේත්‍රයට සහන	500
26.	පරිසර සංරක්ෂණය	2,000
27.	වන සංරක්ෂණය	2,000
28.	වනජීවී ආරක්ෂණය	1,000
29.	පාසල් සංවර්ධනය	5,300
30.	සෞඛ්‍ය හා දේශීය වෙදකම	5,000
31.	ක්‍රීඩා පහසුකම් සංවර්ධන	3,000
32.	සුළු වාරිමාර්ග	2,000
33.	වෘත්තීය හා තාක්ෂණික පුහුණුව	2,000
34.	මගී ප්‍රවාහනය	2,000
35.	අධිකරණ යටිතල පහසුකම්	5,000
36.	මහජන ආරක්ෂාව, නීතිය හා සාමය	500
37.	බන්ධනාගාර රැදවියන්ගේ සනීපාරක්ෂක පහසුකම්	200
38.	වැඩිහිටි හා විශේෂ අවශ්‍යතා සහිත අය සඳහා පහසුකම්	1,000
39.	ගැබිණි මව්වරු	1,000
40.	ගෘහ ආර්ථික	15,000
41.	කුඩා සුපිරි වෙළෙඳසල්	15,000
42.	රාජ්‍ය සේවය ඩිජිටල්කරණය	500
43.	රජයේ සේවකයින්ට යතුරුපැදි	500
44.	ගුරු විදුහල්පති වැටුප් විෂමතා දුරු කිරීම	30,000
45.	උපාධිධාරීන් ස්ථීර කිරීම	7,600
46.	දේශපාලන පලිගැනීම්	100
47.	විශ්‍රාමික වැටුප් විෂමතා	500
48.	බෞද්ධ විහාර නඩත්තු	500
49.	අතුරුදහන් වූවන් සඳහා වන්දි	300
50.	වෘත්තීයවේදීන්ගේ සංගම් වලට දායකත්වය	100
51.	වියදම් ඉතිරි කිරීම	(30,000)

මූලාශ්‍රය: 2021-2022 අයවැය සාරාංශය, ඇමුණුම **IV**

අ 3 වගුව: ප්‍රතිපත්ති ප්‍රමුඛතාවයන් සළකා අමාත්‍යාංශ අතර වියදම් වෙන් කිරීමේදී සිදුකරන ලද උපකල්පන

ජාතික ප්‍රතිපත්ති රාමුව	ප්‍රතිපත්ති ප්‍රමුඛතා අනුව අමාත්‍යාංශ බෙදීම
1. ජාතික ආරක්ෂාව කෙරෙහි ප්‍රමුඛත්වය	ආරක්ෂක අමාත්‍යාංශය; ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය; රාජ්‍ය ආරක්ෂක හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය; මහජන ආරක්ෂක අමාත්‍යාංශය; ප්‍රජා පොලිස් සේවා රාජ්‍ය අමාත්‍යාංශය
2. මිත්‍රශීලී, නොබැඳි විදේශ ප්‍රතිපත්තිය	සංචාරක අමාත්‍යාංශය; කලාපීය සහයෝගිතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය
3. දූෂණයෙන් තොර පරිපාලනය	ශීර්ෂ 1 - 25 විශේෂ වියදම් ඒකක; මුදල් අමාත්‍යාංශය; State Ministry of Money and Capital Market and State Enterprise Reforms; වාහන නියාමනය, බස් රථ ප්‍රවාහන සේවා හා දුම්රිය මැදිරි හා මෝටර් රථ කර්මාන්ත රාජ්‍ය අමාත්; රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය; පළාත් සභා හා පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය; ගුවන් සේවා හා අපනයන කලාප සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
4. ජනතා පැතුම් ඉටු කරන නව ව්‍යවස්ථාව	
5. ඵලවත් පුරවැසියෝ සහ ජවසම්පන්න මානව සම්පත	සමෘද්ධි ශ්‍රම ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය; අමාත්‍යාංශය; දේශීය වෙදකම් ප්‍රවර්ධන, ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් සංවර්ධන සහ ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යාංශය ඖෂධ නිෂ්පාදනය, සැපයීම් හා නියාමන රාජ්‍ය අමාත්‍යාංශය; ප්‍රාථමික සෞඛ්‍ය සේවා, වසංගත රෝග හා කොවිඩ් රෝග පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය; අධ්‍යාපන අමාත්‍යාංශය; කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය; අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, විවෘත විශ්වවිද්‍යාල හා දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය; නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය; දහම් පාසල්, පිරිවෙන් හා භික්ෂු අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශය; තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය, ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
6. ජනතා-කේන්ද්‍රික ආර්ථික සංවර්ධනය	ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය; බලශක්ති අමාත්‍යාංශය; වෙළඳ අමාත්‍යාංශය; සමුපකාර සේවා, අලෙවි සංවර්ධන හා පාරිභෝගික ආරක්ෂණ රාජ්‍ය අමාත්‍යාංශය; කෘෂිකර්ම අමාත්‍යාංශය, පසුගාමී ග්‍රාමීය ප්‍රදේශ සංවර්ධන සහ ශ්‍රමාශ්‍රිත සත්ත්ව පාලන හා සුළු ආර්ථික බෝග වගා ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය; කාබනික පොහොර නිෂ්පාදන ප්‍රවර්ධන හා සැපයුම් නියාමන සහ වී හා ධාන්‍ය, කාබනික ආහාර, එළවළු, පළතුරු, මිරිස්, ඵෑණු හා අර්තාපල් වගා ප්‍රවර්ධනය, බීජ නිෂ්පාදන හා උසස් තාක්ෂණ කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශය; පශු සම්පත්, ගොවිපල ප්‍රවර්ධන සහ

	කිරි හා බිත්තර ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශය; විදුලිබල අමාත්‍යාංශය; වැවිලි අමාත්‍යාංශය; සමාගම් වතු ප්‍රතිසංස්කරණ, තේ හා රබර් වතු ආශ්‍රිත බෝග වගා සහ කර්මාන්තශාලා නවීකරණය හා තේ හා රබර් අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය; පොල්, කිතුල් සහ තල් වගාව ප්‍රවර්ධනය සහ ඒ ආශ්‍රිත කාර්මික නිෂ්පාදන නිෂ්පාදනය සහ අපනයන විවිධාංගීකරණය පිළිබඳ රාජ්‍ය අමාත්‍යාංශය; උක්, බඩ ඉරිඟු, කජු, ගම්මිරිස්, කුරුඳු, කරාබු නැටි, බුලත් ඇතුළු කුඩා වැවිලි බෝග වගා සංවර්ධනය ආශ්‍රිත කර්මාන්ත හා අපනයන ප්‍රවර්ධනය රාජ්‍ය අමාත්‍යාංශය; කර්මාන්ත අමාත්‍යාංශය; බතික්, අත්යන්ත්‍ර රෙදි හා දේශීය ඇඟළුම් නිෂ්පාදන රාජ්‍ය අමාත්‍යාංශය; වේවැල්, පිත්තල, මැටි, ලී බඩු සහ ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය; මැණික් හා ස්වර්ණාභරණ ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශය; ධීවර අමාත්‍යාංශය; විසිතුරු මසුන්, මිරිදිය මත්ස්‍ය හා ඉස්සන් ඇති කිරීම, ධීවර වරාය සංවර්ධන, බහුදින ධීවර කටයුතු හා මත්ස්‍ය අපනයන රාජ්‍ය අමාත්‍යාංශය; සංචාරක අමාත්‍යාංශය
7. තාක්ෂණය-පාදක සමාජය	තාක්ෂණ අමාත්‍යාංශය; ඩිජිටල් තාක්ෂණ හා ව්‍යවසාය සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
8 භෞතික සම්පත් සංවර්ධනය	ප්‍රවාහන අමාත්‍යාංශය; මහාමාර්ග අමාත්‍යාංශය; ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශය; සූර්ය, සුළං සහ ජල විදුලි ජනන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය; ඉඩම් අමාත්‍යාංශය; නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය; නාගරික සංවර්ධන, අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය; ග්‍රාමීය නිවාස සහ ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශය; වතු නිවාස හා ප්‍රජා යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශය; වෙරළ සංරක්ෂණ හා පහත් බිම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය; ජල සම්පාදන අමාත්‍යාංශය; ග්‍රාමීය හා ප්‍රාදේශීය පානීය ජල සම්පාදන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය; වාරිමාර්ග අමාත්‍යාංශය; මහවැලි කලාප ආශ්‍රිත ඇලවේලි හා ජනාවා පොදු යටිතල පහසුකම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය; ග්‍රාමීය කුඹුරු හා ආශ්‍රිත වැව්, ජලාශ සහ වාරිමාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
9. තිරසාර පරිසර කළමනාකරණය	පරිසර අමාත්‍යාංශය; වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශය; වනජීවී රැකවරණය, අලිවැට හා අගල් ඉදිකිරීම ඇතුළු ආරක්ෂක වැඩපිළිවෙලවල් හා කැලෑ නැවත වගා කිරීම සහ වන සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
10. විනය-ගරුක, නීති-ගරුක හා සාරධර්ම සපිරි සමාජය	බුද්ධ ශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය; ජාතික උරුම, ප්‍රාසාංග කලා හා ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය; ජනමාධ්‍ය අමාත්‍යාංශය; අධිකරණ අමාත්‍යාංශය; බන්ධනාගාර කළමනාකරණ හා සිරකරුවන් පුනරුත්ථාපන රාජ්‍ය අමාත්‍යාංශය

මූලාශ්‍රය: ජාතික ප්‍රතිපත්ති ආයතනය විසින් සම්පාදිත

අ **4** වගුව: **රජයේ ප්‍රතිපත්ති ප්‍රමුඛතාවයන් අනුව 2022 වියදම් යෝජනා බෙදා හැරීම (මුළු ප්‍රමාණයෙන්%)**

	පුනරාවර්තන	ප්‍රාග්ධන	එකතුව
1. ජාතික ආරක්ෂාව කෙරෙහි ප්‍රමුඛත්වය	15.8	6.0	11.3
2. මිත්‍රශීලී, නොබැඳි විදේශ ප්‍රතිපත්තිය	0.4	0.0	0.2
3. දූෂණයෙන් තොර පරිපාලනය	62.4	67.9	64.9
4. ජනතා පැතුම් ඉටු කරන නව ව්‍යවස්ථාව	0.0	0.0	0.0
5. ඵලවත් පුරවැසියෝ සහ ජවසම්පන්න මානව සම්පත	15.3	3.3	9.8
6. ජනතා-කේන්ද්‍රික ආර්ථික සංවර්ධනය	3.0	3.2	3.1
7. තාක්ෂණය-පාදක සමාජය	0.1	0.1	0.1
8 භෞතික සම්පත් සංවර්ධනය	1.1	18.4	9.0
9. තිරසාර පරිසර කළමනාකරණය	0.2	0.3	0.2
10. විනය-ගරුක, නීති-ගරුක හා සාරධර්ම සපිරි සමාජය	1.5	0.7	1.2
එකතුව	100.0	100.0	100.0

මූලාශ්‍රය: පාර්ලිමේන්තුව විසින් සපයන ලද දත්ත මත පදනම් වූ ජාතික ප්‍රතිපත්ති ආයතනය විසින් කළ ගණනය කිරීම්.

සටහන: ඇමුණුම 1 මගින් විවිධ ප්‍රතිපත්ති ප්‍රමුඛතා සඳහා වියදම් යෝජනා වෙන් කිරීමේදී කරන ලද උපකල්පන දක්වයි.